ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්

இலங்கை கனிப்பொருள் மணல் லிமிடட்

LANKA MINERAL SANDS LIMITED

වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

ANNUAL REPORT

2022



සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා රජය සතු සීමිත වගකීම සහිත සමාගමකි.

இது முற்று முழுதாக இலங்கை அரசுக்குச் சொந்தமான ஓர் பொறுப்பு வரையறுக்கப்பட்ட கம்பனியாகும்.

A limited liability company fully owned by the Government of Sri Lanka.

දැක්ම

“ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ නිෂ්පාදකයින් අතරින් ජාතික ආර්ථිකයට ප්‍රමුඛතම දායකත්වය ලබා දෙන්නා බවට පත්වීම ”

මෙහෙවර

“හරිත සංකල්පය යටතේ දේශීය හා විදේශීය ගැනුම්කරුවන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීම සහතික කිරීම සඳහා නවීන තාක්ෂණය යොදා ගනිමින් ශ්‍රී ලංකාවේ සංවර්ධනයට උපරිම දායකත්වය ලබාදීම ”

ඉලක්ක (2023 සිට 2027)

- ආයතනයේ නිෂ්පාදනය ක්‍රම, ක්‍රමයෙන් කාල පරිච්ඡේදය තුළ 100% වැඩි කිරීම.
- ඛනිජ වැලි අගය එකතු කිරීමේ ව්‍යාපෘති, කර්මාන්ත සඳහා පියනැගීම.
- යහපත් වැඩපරිසරයක් ඇති කිරීම හා ආයතනයේ පරිපාලන ව්‍යුහය විධිමත් කිරීම තුළින් සේවකයින්ගේ කාර්යයඵල වැඩිකිරීම හා ඒ තුළින් ආයතනයේ කාර්යයඵල වර්ධනය කිරීම.
- දේශීය ඛනිජ වැලි කර්මාන්තය පාරිසරික හිතවාදී ආකාරයට ශක්තිමත් කිරීම හා ප්‍රවර්ධනය තුළින් සහස්‍ර සංවර්ධන ඉලක්ක ලඟා කරගැනීම.

පටුන

ආයතනය පිළිබඳව | 01

ඉතිහාසය | 02
බැනිජවැලි ඇතිවීම හා තැන්පත් වීම | 03
නිෂ්පාදිත හා ප්‍රයෝජන | 04
ධූරාවලිය | 05
සංස්ථාපිත කළමනාකාරණය | 06
විධායක කළමනාකාරණය | 07

කාර්යයඵල වාර්තා | 02

මූල්‍ය කාර්යයඵල | 09
මෙහෙයුම් කාර්යයඵල | 10

පණිවිඩ හා වාර්තා | 03

සභාපතිතුමාගේ පණිවිඩය | 12
අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | 13 - 17

විගණන කළමනාකරණ කමිටු හා විගණන වාර්තාව | 04

විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව | 19
විගණන වාර්තාව | 20 - 31

මූල්‍ය ප්‍රකාශන | 05

මූල්‍ය ප්‍රකාශන | 33 - 38
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 39 - 67

ආයතනය පිළිබඳව

ඉතිහාසය

ලංකා ඛනිජ වැලි සමාගම, 1957 දී කර්මාන්ත සංස්ථා පනත යටතේ, ලංකා ඛනිජ වැලි සංස්ථාව ලෙස ආරම්භ වූ සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා රජය සතු රාජ්‍ය සමාගමකි. ත්‍රිකුණාමලයට කි.මී 54 උතුරින් පුල්මුඩේ වෙරළෙහි විශාල කළු මුහුදු වැලි තැන්පත් වීම සොයාගැනීමෙන් පසු සංස්ථාව, සේවකයින් 40 කින් හා රු. 800,000,000 කින් ආයෝජනයකින් ආරම්භ විය.

ව්‍යාපෘතියේ මූලික වැඩ කටයුතු 1958 දී ආරම්භ වූ අතර පරීක්ෂණ නිෂ්පාදනය 1961 දී ආරම්භ විය. පළමු අපනයනය ඉල්මනයිට් මෙ.ටො.5000 ක් සෘජුව 1963 දී අපනයනය කරන ලදි. 1972 ට පෙර රජය ආසියානු සංවර්ධන බැංකුවෙන් ඇමෙරිකානු ඩොලර් මි.25 ණය මුදලක් ලබාගෙන තෙත චුම්භක වෙන් කිරීම, තෙත දහර වෙන් කිරීම යන්ත්‍ර මගින් යන්ත්‍රාගාරය නවීකරණය කරන ලදි.

ඛනිජ වැලි නිධිය අරිසිමලේ සිට කෝකිලායි දක්වා සැතපුම් 5 ක භූමි ප්‍රදේශයක පැතිරී ඇති අතර භූමිය තුළටද යාර 400 ක් පමණ පැතිරී ඇත. ඊට අමතරව අනෙක් ඛනිජ වැලි නිධිය නිලාවේලි සිට මුලතිව් දක්වා සැතපුම් 45 ක ප්‍රදේශයක පැතිරී ඇත. මෙය ලොව පවතින පොහොසත්ම ඛනිජ නිධියක් ලෙස සැලකේ.

ඛනිජ වැලි නැවිගත කිරීම සඳහා කන්වේයර් පටි සහිත ජැටියක් මෙන්ම දහර වෙන් කිරීම් සඳහා අවශ්‍ය මිරිදිය ජලය ලබා ගැනීම සඳහා යාන්ඔය ජල පොම්පාගාරය ද ඉදිකරන ලදි.


නැගෙනහිර වෙරළේ ඛනිජ වැලි නිධි ප්‍රදේශ



ඛනිජවැලි ඇතිවීම හා තැන්පත් වීම

සැකසුම් යන්ත්‍රාගාරය ත්‍රිකුණාමලයේ නැගෙනහිර වෙරළේ සිට කි.මී.54 කට උතුරින් පුල්මුඩේහි පිහිටා ඇත. පුල්මුඩේ වෙරළ ඛනිජ වැලි වලින් ඉතා පොහොසත් වන අතර ඒවා ඉල්මනයිට්, රැටයිල්, සර්කෝන්, මොනසයිට් සහ ගානට්, 60% වූ ඛනිජ සාන්ද්‍රණයෙන් 65% ක ප්‍රතිශතයට ඉල්මනයිට් හා 10% සර්කොන් වන අතර මෙ.ටො.මිලියන 12.5 ක් වූ මෙතෙක් ගවේෂණය නොකළ වටිනා ඛනිජ පුල්මුඩේ වටා පිහිටා ඇත.





නිෂ්පාදිත හා ප්‍රයෝජන

ඉල්මනයිට් / හයි ටයිටේනියම් ඉල්මනයිට්

මේවා ටයිටේනියම් ඩයොක්සයිඩ් සුදු වර්ණකය නිපදවීම සඳහා භාවිතා කරනු ලබයි. ටයිටේනියම් ඩයොක්සයිඩ් වූ කලි අනෙකුත් වර්ණක හා සැසඳීමේ දී වඩාත් හොඳ සුදු පැහැයක් හා දීප්තිමත්භාවයක් සහිත වර්ණයකි. එසේම ඊයම් සහිත වර්ණයක් හා සැසඳීමේ දී, එහි නිර්විෂ භාවය හා ඉහළ උෂ්ණත්වලට ඔරොත්තු දීමට හැකියාව කැපී පෙනේ. එසේම නිරන්තරයෙන් හිරු එළියට නිරාවරණය වීම හේතුවෙන් වර්ණය වෙනස් වීම් වලට භාජනය නොවන අතර ඉහළ ආවරණ හැකියාවක් පෙන්නුම් කරයි. එබැවින් මෙම ඛනිජ ද්‍රව්‍යයන්ගේ නිමි නිෂ්පාදනයන් කඩදාසි, තීන්ත, ප්ලාස්ටික්, මුද්‍රණ තීන්ත, රබර් හා ඇඟලුම් කර්මාන්ත සඳහා ද යොදාගනී.




සර්කෝන්

සර්කන් වල ප්‍රධාන ගුණාංග වන්නේ මළ නොබැඳෙන හා අධික උෂ්ණත්වයට ඔරෝත්තු දීමට හැකියාව පැවතීමයි. ඒ අනුව මේවා උදුන් වල උෂ්ණත්ව නල සහ වාත්තු කර්මාන්තය සඳහා භාවිතා කරයි. එසේම සෙරමික් කර්මාන්තය සඳහා වර්තමානයේ දී බහුලව යොදාගනී. සර්කෝන් වලින් ලබාගන්නා සර්කෝනියම් ලෝහය, රූපවාහිනී, සම්, ජලය නොරැඳෙන රෙදිපිළි සහ බෙහෙත් ආවරණ සඳහා ද යොදා ගනී.

රූටයිල්

ලොව වත්මන් සහ අනාගත ලෝහය ලෙස හඳුන්වන ටයිටේනියම් ලෝහය නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය ලෙස රූටයිල් යොදාගනී. ටයිටේනියම් ලෝහය ඉතා ආලෝකමත්ය, (ඇලුමිනියම් ලෙස) යකඩ ලෙස ඉතා ශක්තිමත් මළ නොබැඳෙන හා ඉහළ උෂ්ණත්වයකට ඔරොත්තු දේ.
මීට අමතරව රූටයිල් ඛනිජවැලි, වෙල්ඩින් කර්මාන්තය සඳහා ද යොදාගනී.

ධුරාවලිය


අධ්‍යක්ෂ මණ්ඩලය
සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ
ප්‍රධාන කාර්යාලය
යන්ත්‍රාගාරය
සාමාන්‍යාධිකාරී
නි.සා (මූල්‍ය)
නි.සා (මානව සම්පත් හා පාලන)
නි.සා,(යන්ත්‍රාගාර /මෙහෙයුම්)
ජෙෂ්ඨ.මූ.කළමනාකරු
ජෙෂ්ඨ.මූ. කළමනාකරු
ප්‍රධාන ඉංජිනේරු (කැ/සැ)
ප්‍රධාන ඉංජිනේරු (නඩත්තු)
ප්‍රධාන රසඳ
අභ්‍යන්තර විගණක
අලෙවි කළමනාකරු
මූල්‍ය කළමනාකරු
සැපයුම් කළමනාකරු
මානව සම්පත් කළමනාකරු
ආරක්ෂක කළමනාකරු
කැ/සැ ඉංජිනේරු (2)
නිෂ්පාදන ඉංජිනේරු (2)
සිවිල් ඉංජිනේරු (2)
යාන්ත්‍රික ඉංජිනේරු (2)
විදුලි ඉංජිනේරු (2)
රසඳ (2)
විගණන නිළධාරි (2)
සැපයුම් නිළධාරි
ලේකම් (02)
පරිපාලන නිළධාරි
හිඟුම් නිළධාරි
හිඟුම් නිළධාරි
සැපයුම් නිළධාරි (02)
පරිපාලන නිළධාරි (02)
ආරක්ෂක නිළධාරි

සංස්ථාපිත කළමනාකරණය

මුදිත විජේසිංහ මහතා	-	සභාපති **(2022.01.01 – 2022.09.14)**
වෛද්‍ය උදේනි දසනායක මහතා	-	සභාපති **(2022.09.15 සිට)**
එස්.ඩබ්.මදනායක මහතා	-	අධ්‍යක්ෂ/භාණ්ඩාගාර නියෝජිත
ආර්.එම්.ජේ.උදය කුමාර මහතා	-	අධ්‍යක්ෂ
ආර්.එච්.රංජිත් උපාලි මහතා	-	අධ්‍යක්ෂ
රංජන් අතුකෝරළ මහතා	-	අධ්‍යක්ෂ
එම්.ජී.සුනිල් මහතා	-	අධ්‍යක්ෂ
පී.බී.ඒ.සංජීව මහතා	-	අධ්‍යක්ෂ

විධායක කළමනාකරණය

සාමාන්‍යාධිකාරී **(2022.01.01 - 2022.09.10)**	-	උදය ද සිල්වා මහතා **B.Sc, M.Sc (Geology) (IGSL)**
සාමාන්‍යාධිකාරී **(2022.09.11 සිට)**	-	එච්.එම්.ජේ.එම්.හේරත් මහතා **BSC, MBA, SLAS**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී යන්ත්‍රාගාර/මෙහෙයුම්	-	එස්.ඥානේෂ්වරන් මහතා **B.Sc. Eng., AMIESL**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන)	-	එච්.බී.එන්.ඩබ්ලිව්.අනුර කුමාර මහතා **B.A, Higher Dip. In Philosophy, Higher Dip. In Counselling,**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) වැඩ ආවරණ **(2022.02.01 – 2022.10.31)**	-	පී.පී.ජේ.ආර්.පතිරණ මහතා **MBA**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) වැඩ බලන **(2022.11.01 සිට)**	-	කේ.ඒ.බන්දුල කුරුප්පු මහතා **SLAcS**
ප්‍රධාන අභ්‍යන්තර විගණක	-	එම්.ඒ.අයි.ජී.ජයතිලක මහතා **L.I.C.A.**
සැපයුම් කළමනාකරු	-	ඩබ්.ඩබ්.ඩී.ඩබ්.කුමාර මහතා, **BSC**
අලෙවි කළමනාකාරු	-	පී.බී.එම්.විජේබණ්ඩාර මහතා, **B.Sc.**
ප්‍රධාන කැණීම් සැකසුම් ඉංජිනේරු	-	එස්.රාජගුරු මහතා **B.S.C - Eng.**
ප්‍රධාන නඩත්තු ඉංජිනේරු	-	ආර්.එම්.ආර්.බණ්ඩාර මහතා, **B.S.C - Eng.**
ජ්‍යෙෂ්ඨ මූල්‍ය කළමනාකරු	-	ඩබ්ලිව්.ජේ.ඒ.එම්.එස්.ජයසූරිය මහතා
නීති නිළධාරී, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්	-	එම්.දමයන්ති කුරේ මිය **LLM, PgdMLRHRM, B.A., Attorney at Law**

කාර්යයඵල වාර්තා


මූල්‍ය කාර්යයඵල

ආයෝජන	විකුණුම් ආදායම	භාණ්ඩාගාරයට ලබා දුන් ලාභාංශ
6,500 (රු.මි)	7,562 (රු.මි)	1,725 (රු.මි.)
මුළු වත්කම්	**කොටසක ඉපයුම**	
11,063 (රු.මි)	61.64 (රු.)	


විකුණුම් ආදායම



අදායම




දළ ලාභය



මෙහෙයුම් කාර්යයඵල

ඉල්මනයිට් **29,741**	රූටයිල් **740**	නිෂ්පාදනය **2022** (මෙ.ටො)
සර්කෝන් **267**	හයි ටයි ඉල්මනයිට් **1,750**	



පණිවිඩ සහ වාර්තා

සභාපතිගේ පණිවිඩය

ඛනිජ වැලි සමාගමේ 2022 මුදල් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව ඉමහත් සතුටකින් ඉදිරිපත් කරමි.

අප 1957 සිට බර ඛනිජ වැලි, නිෂ්පාදනය හා අමුද්‍රව්‍ය මිළදී ගන්නා කර්මාන්ත වලට අපනයනය කර ඇත. අපගේ සම්පූර්ණ සැකසුම් ක්‍රමවේදය ගුරුත්වාකර්ශන වෙන් කිරීම්, චුම්භක වෙන් කිරීම් හා සන්නායක වෙන් කිරීම් තුළින් නැගෙනහිර වෙරළේ ඇති අපනයනය කල හැකි ඛනිජ වැලි වන ඉල්මනයිට්, රූටයිල්, සර්කෝන්, හයි ටයි ඉල්මනයිට් සහ කෘඩ් මොනසයිට් ඛනිජ වැලි නිෂ්පාදනය කරයි.

අපගේ පර්යේෂණ හා සංවර්ධන ඒකකයේ ගැඹුරු සමාලෝචනයක් ලෙස බලශක්ති තීව්‍ර හා පාරිසරික සංවේදී නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා අගය එකතු කිරීමට වඩා පවතින නිෂ්පාදනවල මිල සංශුද්ධතාවය වැඩි දියුණු කිරීම බව අපට අවබෝධ විය. තවද බර ඛනිජ වැලි නිෂ්පාදනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට තරගකාරී අගය එකතු කිරීමට අප සැලසුම් කරමු.

ඊට අමතරව ඵලදායිතාව ඉහළ නැංවීමට හා නාස්තිය සහ අනවශ්‍ය වියදම් ඉවත් කිරීම සඳහා සාමාන්‍ය කළමනාකරණ පිළිවෙත් ක්‍රමානුකූලව වැඩි දියුණු කර ඇත. අප නිෂ්පාදන පිරිවැය සාර්ථකව අඩු කර, නිෂ්පාදනය වැඩි කර, ඉහළ දළ ලාභ ආන්තිකය, ඉතිහාසයේම ඉහළම ලාභාංශ, ඉතිහාසයේ ඉහළම ආදායම් බද්ද, කොටසක ඉපයුම රු 15 සිට 61 දක්වා ඉහළ නැංවීම, මානව සම්පත් තොරතුරු පද්ධතියක් හඳුන්වා දීම සඳහා SLIDA ආයතනය වෙතින් සති දෙකක පරිගණක පුහුණු වැඩසටහනක් හඳුන්වා දීම, අදාළ නොවන ප්‍රවාහනයේ දී සිදුවන නාස්තිය අවම කිරීම, කාර්යයඵල හා සම්බන්ධ නිෂ්පාදන දිරි ගැන්වීම, සංවිධානයේ සෑම සේවකයෙකුටම රැකියා විස්තරය හඳුන්වාදීම, එක් එක් ඛනිජ සඳහා නිවැරදි මිනුම් ලකුණක් ලබා ගැනීම සඳහා ඛනිජ බුද්ධි ඒකකයක් හඳුන්වාදීම, නිෂ්පාදන ප්‍රමාණය වැඩි කිරීම සඳහා ජංගම බලාගාරයක් පද්ධතියට හඳුන්වා දීම.

අපගේ අඛණ්ඩ උත්සහයේ සහ කැපවීමේ ප්‍රතිඵලයක් ලෙස 2022 වසරේ සිට දළ ලාභ අනුපාතයේ ඉහළ යාමේ ප්‍රවණතාව, ශුද්ධ ලාභ අනුපාතයේ ඉහළ යාමේ ප්‍රවණතාව, ලාභාංශ ප්‍රතිලාභ වැඩි කිරීම, රජයට අඛණ්ඩව ඉහළ ආදායම් බදු ගෙවීම සහ සේවක ප්‍රසාද දීමනා ඉහලනැංවීම ඇතුළු සෞඛ්‍ය සම්පන්න මූල්‍ය දර්ශක නිර්මාණය කිරීමට අපට හැකි විය.

තවද, අප ඉදිරියේ දී කෝකිලායිහි හැරවුම් ප්‍රධාන නිෂ්පාදන කම්හල සහ ටයිටේනියම් ස්ලැග්, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අගය එකතු කළ නිෂ්පාදන කම්හලක් සංවර්ධනය කරීමට කටයුතු කරන්නෙමු.

මෙම අර්බුදකාරී තත්වය මග හරවා ගැනීම සඳහා වැඩි විදේශ මුදල් ඉපැයීම සඳහා මෙම දැවැන්ත ජයග්‍රහණය කිරීමට මෙම විශිෂ්ට නායකත්වය සහ අඛන්ඩ මගපෙන්වීම ලබාදීම පිළිබඳව මෙම අමාත්‍යාවරයාට ද ස්තූතිවන්ත වෙමි. තවද, ගමන පුරාවට ඔවුන් දැරූ දැවැන්ත උත්සහය වෙනුවෙන් කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්තුමියට සහ ආයතනයෙහි කළමනාකරණ කණ්ඩායමට සහ සමස්ත සේවක පිරිසට මම ස්තූතිවන්ත විය යුතුය.

වෛද්‍ය උදේනි දසනායක
MBBS, MBA, MPH (NYU –USA)
සභාපති

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂවරුන් විසින් 2022 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කල මූල්‍ය ප්‍රකාශන සහ විගණන වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරනු ලැබේ.

ප්‍රධාන ක්‍රියාකාරකම්

ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් හි සාංගමික ව්‍යාවස්ථාවලියෙහි දැක්වෙන පරිදි ප්‍රධාන අරමුණු වන්නේ


1. බර ඛනිජ වැලි කැණීම් කිරීම, වෙන් කිරීම්, පිරිපහදු කිරීම හා සැකසීම.

2. වෙරළාශ්‍රිත බර ඛනිජ වැලි උපයෝගි කරගෙන වාණිජමය හෝ කාර්මික වටිනාකමක් ඇති ද්‍රව්‍ය හෝ ඒ ආශ්‍රයෙන් නිපදවිය හැකි කුමන හෝ ද්‍රව්‍යයන් නිපදවීම හා අලෙවි කිරීම


3. වෙරළාශ්‍රිත බර ඛනිජ වැලි පිරි පහදුවේදි හෝ සැකසීමේ ප්‍රතිඵලයක් ලෙස නිපදවන කුමන හෝ අතුරුද්‍රව්‍ය නිෂ්පාදනය හා අලෙවිය.

නිෂ්පාදනය

මෙම වර්ෂයේ නිෂ්පාදනයන් මෙට්‍රික් ටොන් වලින් -



ප්‍රධාන නිෂ්පාදන (මෙ.ටො.)




අතරමැදි නිෂ්පාදන (මෙ.ටො.)

විකුණුම්

ඛනිජවැලි මෙ.ටො.64,375.04 ක් අලෙවි කිරීම මගින් ආයතනය රු.මි.7,562 ක් උපයාගෙන ඇත.

	මෙ.ටො.	රු.මී
ඉල්මනයිට්	60,150.67	6,187
රූටයිල්	2,300.32	1,036
සර්කෝන්	150.04	105
හයි ටයි ඉල්මනයිට්	1,774.01	234
	64,375.04	7,562



අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

ප්‍රතිඵල හා ලාභාංශ

සමාගමේ බදු පසු ලාභය රු.මිලියන 4,931කි. ලාභාංශ සඳහා රු.මිලියන 1,725 ක් වෙන්කර ඇත.

රු.මී

	2022	2021
දළ අදායම	7562	2720
දළ ලාභය	6726	1983
ශුද්ධ ලාභය	4931	1205

දේපළ, පිරියත හා උපකරණ

සටහන් අංක 13 හි විස්තරවලට අනුව 2022 දෙසැම්බර් 31 දිනට දේපළ හා පිරියත උපකරණවල ලියා තැබූ අගය එහි මූලික පිරිවැය වූ රු.මිලියන 2,269 න් සියයට 53 ක් පමණ විය. කෙරීගෙන යන ප්‍රග්ධන වැඩවල අගය මිලියන 160කි. මෙය යන්ත්‍රාගාර ප්‍රතිස්ථාපනය සඳහා වූ පැහැදිලි දර්ශකයක් වේ.

ස්ථාවර වත්කම්වලට වර්ෂය තුළ එකතු කිරීම් රු.මිලියන 143 ක් විය.

ප්‍රකාශිත ප්‍රාග්ධනය

රු.මි.800 ක ප්‍රකාශිත ප්‍රාග්ධනය නොවෙනස්ව පැවතුනු අතර, භාණ්ඩාගාර ලේකම් විසින් සියළුම කොටස් දරයි.

අත්තිකාරම්

සීමාසහිත රාජ්‍ය සම්පත් කළමණාකරන සංස්ථාවට 2012 වර්ෂයේ දී ලබාදුන් අත්තිකාරම් මුදල් මෙම වර්ෂයේ දී සම්පූර්ණයෙන්ම කපා හැර ඇත.

කෙටිකාලීන මූල්‍ය වත්කම්

2022 දෙසැම්බර් 31 වැනි දිනට කෙටි කාලීන මූල්‍ය වත්කම් රු.මිලියන 8,342 කි. මෙය 2021 වර්ෂයට වඩා වැඩි වීමකි.

කෙටිකාලීන ණය

මූල්‍ය කල්බදු පහසුකම යටතේ ලංකා බැංකුවෙන් අවුරුදු 4කින් ගෙවීමේ පදනමට වාහන 6 ක් අත්පත් කර ගන්නා ලදී. 2022.12.31 දිනට ගෙවිය යුතු මුදල රු.මි.5.8 කි.

බදුකරණය

වර්ෂයකට අදායම් බද්ද සඳහා රු.මිලියන 1,229 ක ප්‍රතිපාදන වෙන් කරන ලදි.

කොටස් තොරතුරු

කොටසක මූලික ඉපයීම 2021 වර්ෂයේ දී රු.15.06 ට සාපේක්ෂව 2022 වර්ෂයේ දී රු.61.64 ක් දක්වා වැඩි විය.

මූල්‍ය විශේෂතා

		2018	2019	2020	2021	2022
විකුණුම් ආදායම	- රු. මි	1,542	3,891	697	2,720	7,562
දළ ලාභය	- රු. මි	1,056	2,816	388	1,983	6,941
වෙනත් ආදායම්	- රු. මි	124	154	313	245	214
බද්දට පෙර ලාභය	- රු. මි	622	2,278	(51)	1,387	6,160
බද්දට පසු ලාභය	- රු. මි	516	1,928	69	1,205	4,931
පොදු කාර්යය වියදම	- රු. මි	326	407	550	547	**775**
මුළු වත්කම	- රු. මි	3,945	5,295	5,422	5,846	11,064
මුළු වගකීම්	- රු. මි	933	1,940	2,034	1,679	3,701
කොටස් හිමියන්ගේ අයිතිය	- රු. මි	3,012	3,354	3,387	4,167	7,363
අදායම් බදු	- රු. මි	65	280	-	171	1,229
භාණ්ඩාගාරය සඳහා ලාභාංශ	- රු. මි	180.7	670.3	-	400	1,725
සේවක සංඛ්‍යාව		656	645	662	607	557
ශුද්ධ ලාභ අනුපාතය		40%	59 %	-	44%	65%
ආයෝජන මත ප්‍රතිලාභය		64%	241%	-	150%	616%
ජංගම අනුපාතය		3:1	2:1	2.1	2.1	2.1
කොටසක ඉපයුම	- රු.	6.46	24.10	0.86	15.06	61.64

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

අනාගත සැලසුම්

සමාගමේ අනාගත සැලසුම් නම් : -

- ඉතා වැදගත් අදියරක් ලෙස සර්කන් අගය එකතුකළ යන්ත්‍රාගාරය 2023 වසරේ ආරම්භ කිරීමට සමාගම සැලසුම් කිරීම.
- ප්‍රවාහන පිරිවැය අඩුකරමින් බර ඛනිජ සාන්ද්‍රණය වැඩි කර නිශ්පාදනය වැඩි කිරීම සඳහා පුල්මුඩේ හා පොඩුවකට්ටු වල ජංගම යන්ත්‍රාගාර ඉදිකිරීම.
- නව ඛනිජ නිධි අලුතින් හඳුනා ගැනීම.
- කෝකිලායි හා කොක්කුතුඩුවායි කැනීම් බලපත්‍රය ලබා ගැනීම. (දෙවන අදියර)
- කැනීම් කල ප්‍රදේශ කැනීම් කල පසු කාලයක් වෙන් කර ගැනීම.
- පුද්ගලික හා රජයට අයත් ඉඩම් කැනීම් සඳහා ලබා ගැනීම.
- ජල සැපයුම් පද්ධතිය ස්වයංක්‍රීය කිරීම.
- මානව සම්පත් කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දීම.
- විදුලි හා විදුලි බෙදා හැරීමේ පද්ධතිය නවීකරණය කිරීම.
- කෝකිලායි ප්‍රදේශයේ නව ඛනිජ සැකසුම් යන්ත්‍රාගාරය ඉදි කිරීම.
- වෙරළ ගවේෂණය බලපත්‍ර ලබා ගැනිම.
- පුහුණු හා සංවර්ධන සැලැස්මක් හඳුන්වාදීම.
- මූල්‍ය, පරිපාලන හා විනය සම්බන්ධ උපදෙස් හා මාර්ගෝපදේශ සකස් කිරීම.
- නව කැනීම් ප්‍රතිපත්තියක් හා කැනීම් සැලැස්මක් හඳුන්වාදීම.
- පරිසර කළමනාකරණ පද්ධතියක් පිළියෙල කිරීම.
- අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තියක් හඳුන්වාදීම.
- ආයතනයට කයිසන් සංකල්පය හඳුන්වාදීම.

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

රැකියා ප්‍රතිපත්ති

2022.12.31 වන දිනට සේවකයින් සංඛ්‍යාව 557 ක් විය. වර්ෂය තුළදී කළමනාකරණය විසින් මානව සම්පත කළමනාකරණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදි.

ව්‍යවස්ථාපිත ගෙවීම්

සේවකයින්ට සහ රජයට සම්බන්ධ සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් අදාල දිනට නිම කර ඇති බවට අධ්‍යක්ෂකවරුන් ඔවුන්ගේ දැනුම සහ විශ්වාසයට අනුව සෑහීමකයට පත් වේ.

අධ්‍යක්ෂකවරුන්ගේ කොටස් හිමිකම

අධ්‍යක්ෂකවරුන් විසින් සමාගමේ කිසිදු කොටසක් සඳහා හිමිකමක් නොදරයි. මුළු කොටස් හිමිකම (100%) මහා භාණ්ඩාගාරයේ ලේකම් සතුවේ.

සංස්ථාපිත සමාජ වගකීම

සංස්ථාපිත සමාජ වගකීම් ඉටුකිරීම සඳහා සමාගම විසින් රු.මි.1.6 ක් වැය කර ඇත. සමාජ සුභසාධන කටයුතු සඳහා අනුග්‍රාහකත්වය දැක්වීම, ආගමික කටයුතු, අධ්‍යාපනික කටයුතු ආදිය මේ යටතේ සිදුකර ඇත.

ගිවිසුම පිළිබඳ අධ්‍යක්ෂකවරුන්ගේ බැඳියාව

සමාගම සමඟ ඇතිකරගත් කිසිදු ගිවිසුමක් හෝ යෝජිත ගිවිසුම් තුළ අධ්‍යක්ෂකවරුන්ගේ සෘජු හෝ වක්‍ර බැඳීමක් නොමැත.

සාංගමික යහපාලනය / අභ්‍යන්තර පාලනය

සමාගමෙහි අභ්‍යන්තර පාලනය පිළිබඳ වගකීම අධ්‍යක්ෂකවරුන් විසින් දරනු ලබයි. වත්කම් ආරක්ෂා කිරීම, උචිත ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සහ විශ්වාසනීය මූල්‍ය තොරතුරු උත්පාදනය සහතික කිරීම සඳහා සමාගමේ පාලන පද්ධතිය නිර්මාණය කර ඇත. කෙසේ වුවත්, ඕනෑම පද්ධතියකට හැකි වන්නේ සාධාරණ සහතික කිරීමක් ලබාදීම පමණක් වන අතර, වැරදි හා අක්‍රමිකතා වැළැක්වීම හෝ සාධාරණ කාලයක් තුළ ඒවා හඳුනා ගැනීම පිළිබඳ නිරපේක්ෂ සහතිකයක් ලබා දිය නොහැක.

මූල්‍ය ප්‍රකාශන කට්ටලය අත්සන් තබන දින දක්වා අභ්‍යන්තර පාලන පද්ධතියේ කාර්යක්ෂමතාව පිළබඳව අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත් වේ.

අඛන්ඩ පැවැත්ම

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අඛන්ඩ පැවැත්ම පිළිබඳ පදනම උපයෝගී කරගෙන ඇත.

විගණකවරුන්

2022 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වසර සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

ලේකම්වරුන්

සී/ස කෝපරේට් එෆෙයාර් පුද්ගලික සමාගම සමාගම් ලේකම් ලෙස කටයුතු කරන ලදි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි ,
කෝපරේට් එෆෙයාර් පුද්ගලික සමාගම.

විගණන කළමනාකරණ කමිටුව
හා
වාර්ෂික විගණන වාර්තාව

විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

2002 යහ පාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව ස්ථාපිත කල යුතු විගණන හා කළමණාකරණ කමිටුව 2022 ජනවාරි මස 16 වන දින පත් කරන ලදි.

කෙසේ වුවද 2021 සිට 2022 දක්වා පවතින තත්ත්වය තුල පහත සඳහන් නිලධාරින්ගෙන් සමන්විත වන පරිදි විගණන හා කළමනාකරණ කමිටුව පත් කරන ලදි.

1. එස්. ඩබ්.මදනායක මහතා - සභාපති
   (මහා භාණ්ඩාගාර නියෝජිත/අධ්‍යක්ෂ - ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්)

2. ආර්. එන්.ජේ.උදය කුමාර - සාමාජික
   (අධ්‍යක්ෂ - ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්)

3. ආර්. එච්.රංජිත් උපාලි මහතා - සාමාජික
   (අධ්‍යක්ෂ - ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්)


සමාලෝචිත වර්ෂය තුළදී විගණන හා කළමනාකරණ කමිටුව තුන්වරක් රැස්විය. අභ්‍යන්තර විගණන කාර්තුමය වාර්තා පිළිබඳ ගැඹුරින් සාකච්ඡා කරන ලද අතර ජාතික විගණන කාර්යාලයෙන් වරින් වර නිකුත් කරන ලද විගණන විමසුම හා වාර්තා සාකච්ඡා කර අවශ්‍ය උපදෙස් හා තීරණ කළමනාකරණය වෙත ලබාදුන් අතරම වැඩිදුර සාකච්ඡා කර තීරණයන් ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කරන ලදි.

නීරික්ෂකයන් ලෙස කර්මාන්ත ආමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක හා ජාතික විගණන කාර්යාලයේ නිලධාරින්ද සහභාගි වන ලදි.

එමෙන්ම විගණන ගැටලුවලට අමතරව කළමනාකරණ තොරතුරු හා ගැටලු ද කමිටුවට ඉදිරිපත් කරන ලද කරුණු ද වැඩි දුර සාකච්ඡා කරමින් අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදි.

එස්. ඩබ්.මදනායක මහතා
සභාපති
විගණන හා කළමනාකරණ කමිටුව

විගණන වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } අයිඩබ්ලිව්එම්/සී/එල්එම්එස්එල්/1/22 මගෙ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2023 අගෝස්තු 17 දින

LANKA MINERAL SANDS LTD. 21 AUG 2023 FINANCE DIVISION (REVENUE & BOOK KEEPING)

18 AUG 2023 DIVISION COLOMBO

සභාපති,

ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්

ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්හි 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් :- 1. ලේකම්, කර්මාන්ත අමාත්‍යාංශය
2. ලේකම්, මූදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } අයිඩබලිව්එම/ඕ/එල්එම්එස්එල්/1/22 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2023 අගෝස්තු 17 දින

සභාපති,

ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්.

ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්හි 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්හි (“සමාගම”) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 ඡේදය ප්‍රකාරව වත්කම්වල අපේක්ෂිත ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකදීම සමාලෝචනය කරනු ලැබිය යුතු අතර අපේක්ෂාවන් කලින් ඇස්තමේන්තුවලට වඩා වෙනස් වන්නේ නම් එම වෙනස්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 8 අනුව ගිණුම්ගත කළ යුතු වුවත්, සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති, දැනට භාවිතයේ පවතින පිරිවැය රු.508,756,403 ක් වූ ජංගම නොවන වත්කම් අයිතම 3,135 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) සමාගමේ කටයුතුවලින් අගතියට පත් විවිධ පුරවැසියන් හා ගනුදෙනුකරුවන් විසින් සමාගමට එරෙහිව අධිකරණවල නඩු 23 ක් පවරා ඇති අතර ඉන් නඩු 3 කට අදාළව රු.687,000,000 ක හා තවත් නඩුවකට අදාළව ඇ.ඩොලර් 2,269,119 ක අසම්භාව්‍ය වගකීම් ඇතිවිය හැකි බව නීති නිලධාරී විසින් විගණනයට තහවුරු කර තිබුණි. තවද, නොගෙවන ලද ණය අයකර ගැනීමට සමාගම විසින් රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව හා ශ්‍රී ලංකා වැවිලි සංස්ථාව යන ආයතන වලට එරෙහිව පිළිවෙලින් රු. මිලියන 650 ක් හා රු.මිලියන 35 ක් ඉල්ලා නඩු 02 ක් පවරා තිබුණි. උක්ත නඩු සම්බන්ධයෙන් කොරතුරු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 හි 86 හා 89 ඡේද ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) වෙරළ සම්පත් හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් බනිජ වැලි කැණීම සඳහා 2017 සිට 2021 සැප්තැම්බර් 06 දක්වා කාලයට අදාළව සමාගම වෙත නිකුත් කර තිබුණු බලපත්‍ර 5 ක් මගින් කැණීම් කළ යුතු බවට නියම කර තිබුණු වැලි කියුබ් ප්‍රමාණය ඉක්මවා වැලි කැණීම් කිරීම හේතුවෙන් එම දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.74,583,515 ක ගාස්තු වගකීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී මෙහෙයුම් කටයුතු සඳහා වැයකර තිබුණු රු.4,292,294 ක් වියදම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට තැන්පතු ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ලාභය සහ ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයට අදාළ රු.18,115,382 ක් වූ අන්තර්ග්‍රහණය නොකළ නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදන වියදමක් ලෙස සලකා අන්තර්ග්‍රහණය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදන පොදු කාර්යය පිරිවැයෙන් රු.2,434,793 ක් අන්තර්ග්‍රහණය නොකර වෙනත් ණය ගැනියෝ යටතේ

2

දක්වා තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය රු.15,680,589 කින් අඩුවෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමාගමේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන සමාගමේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබෙනම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

විගණන වාර්තාව

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

විගණන වාර්තාව

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ ඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

5

විගණන වාර්තාව

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2007 අංක 7 දරන සමාගම් පනතේ 163(2) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2(අ) ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දී ඇති මෙහෙයුම් අත්පොතේ 3.5 ඡේදය	සමාගමේ සේවකයන් දෙදෙනෙකු 2022 ඔක්තෝබර් 17 දින හා නොවැම්බර් 29 දින සිට අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව කර්මාන්ත අමාත්‍යාංශය වෙත නිදහස් කර තිබුණු අතර ඔවුන් වෙනුවෙන් වැටුප්, අතිකාල දීමනා, අනෙකුත් දීමනා හා දිරිදීමනා ලෙස එකතුව රු.439,142 ක් සමාගම විසින් ගෙවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

පුල්මුඩේ යන්ත්‍රාගාර පරිශ්‍රයේ පිහිටි සභාපති නිලනිවස අලුත්වැඩියා කිරීමේ කාර්යය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාර පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර හෝ ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කර හෝ කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීමෙන් හෝ තොරව 2021 පෙබරවාරි 03 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා රු.31,598,049 ක් වැයකර පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන්ගෙන් ඉටුකරවාගෙන තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) විනාශ වී ඇති කොඩබේ යන්ත්‍රාංගනයේ පැවති රු.9,831,234 ක් වටිනා ටග් යාත්‍රා 03 ක් සහ බත්තල් 06 ක් වසර 26 කට ආසන්න කාලයක සිට නිෂ්කාර්යව දිරාපත්වෙමින් පැවතුණු අතර මේවා අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. මේවායේ ආරක්ෂාව සඳහා රු.2,597,326 ක ආරක්ෂක වියදමක් සමාලෝචිත වර්ෂයේදී දරා තිබුණි.

(ආ) ඉන්ධන වියදම් සියයට 50 කින් ඉතිරි කර ගැනීමේ අරමුණින් රු.42,370,234 ක් වටිනා වියලන යන්ත්‍රයක්(Dryer) 2016 ජුනි 30 දින ආනයනය කර ඒ සඳහා රු.1,164,350 ක ප්‍රමාද ගාස්තු ද ඇතුළුව රු.43,838,767 ක් ගෙවා තිබුණද, එකී යන්ත්‍රය සවිකිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා පුල්මුඩේ යන්ත්‍රාගාරය තුළ සිදුකළ යුතු කාර්යයන් අවසන් නොකිරීම හේතුවෙන් එම යන්ත්‍රය භාවිතා කිරීමට විගණිත දින වූ 2023 මැයි 31 දක්වා නොහැකි වී තිබුණි.

(ඇ) 2020 පෙබරවාරි 12 වන දිනැති අංක අමප/20/0226/224/006/ටීඩීආර් දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අමුද්‍රව්‍ය ස්වරූපයෙන්ම බනිජ වැලි අපනයනය කිරීමෙන් තොරව අගය එකතු කරන ලද නිෂ්පාදන විදේශයන් වෙත යැවීමට සමාගම අවධානය යොමු කළ යුතුව තිබුණද ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග විගණිත දින වූ 2023 මැයි 31 දින දක්වා ගෙන නොතිබුණු අතර අමුද්‍රව්‍ය ස්වරූපයෙන් ම බනිජ වැලි අපනයනය කර තිබුණි.

(ඈ) පුල්මුඩේ යන්ත්‍රාගාර පරිශ්‍රයේ තිබුණු රු.53,695,105 ක් වටිනා වීල් ලෝඩර් හතරක්, රු.800,000 ක් වටිනා ලොරි රථයක් වර්ෂ 5 ක සිට නිෂ්කාර්යව තබා තිබුණි. මීන් රු.36,959,917 ක් වටිනා වීල් ලෝඩර් යන්ත්‍ර 2 ක් කඩිනමින් අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ විය.

(ඉ) සමාගම විසින්, උපරිම ආර්ථික ප්‍රතිලාභ රටට ලබා ගැනීම සඳහා තිරසර ආකාරයට දළ වැලි කැණීම, පෙරසැරි කිරීම, අගය එකතු කිරීම හා විකිණීම 2022-2026 කාලපරිච්ඡේදය තුළ සිදු කිරීම ඉලක්ක කර තිබුණු අතර ඒ අනුව මුලතිව් දිස්ත්‍රික්කයේ කෝකිලායි හි නව යන්ත්‍රාගාරයක් ඉදිකිරීම සඳහා වර්ෂ කීපයක සිට කටයුතු කරමින් පැවතුණි. එයට අදාළව පහත නිරීක්ෂණයන් ඉදිරිපත් කරනු ලැබේ.

(i) 2013 පෙබරවාරි 13 දින රු.මිලියන 2.25 කට හෙක්ටයාර 17.69 ක ඉඩමක් මිලදී ගෙන තිබුණි. යන්ත්‍රාගාර කටයුතු සැලසුම් කිරීමට පෙර එම වර්ෂයේදීම

රු.39,339,472 කට සර්පිලාකාර යන්ත්‍රයක් (Spiral Machine) මිලදී ගෙන තිබුණු අතර එම යන්ත්‍රය පුල්මුඩේ යන්ත්‍රාගාරයේ නිෂ්කාර්යව තබා තිබුණි.

(ii) යන්ත්‍රාගාරයේ කටයුතු සමාලෝචිත වර්ෂය තෙක් ආරම්භකර නොතිබුණද ඒ සඳහා 2015 වර්ෂයේදී සේවකයන් 117 ක් බඳවාගෙන තිබුණු අතර එම සේවකයන්ගේ වැටුප් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.107,100,479 ක් වැය කර තිබුණි.

(iii) කෝකිලායි සිට කොක්කුතොඩුවායි දක්වා වන වෙරළ තීරයේ දළ වැලි කියුබ් 30,000 ක් කැණීම් සඳහා සමාගම 2021 අගෝස්තු 12 දින රු.15,000,000 ක් ගෙවා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙතින් අංක P/21/90 දරන බලපත්‍රය ලබාගෙන තිබුණු අතර එම බලපත්‍රය සමාලෝචිත වර්ෂයේ අගෝස්තු 11 දින අවළංගු වී තිබුණි. ඊට අදාළව එම කාලය තුළ වැලි කියුබ් 3520 ක් පමණක් කැණීම් කර එම වැලි ප්‍රමාණය ද ප්‍රයෝජනයට නොගෙන ගොඩගසා තිබුණි.

(iv) කෝකිලායි සිට කොක්කුතොඩුවායි දක්වා වන කැණීම් භූමිය පුනරුත්ථාපනය කිරීමේ කටයුතු අවසන් කර වෙරළ සංරක්ෂණ බලපත්‍රය අලුත් කර ගැනීමට සමාගම කටයුතු කර නොතිබීම හේතුවෙන් එම ප්‍රදේශයේ හෙක්ටයාර 1.9621 ක භූමි ප්‍රමාණයක් සඳහා 2022 ජූලි 01 දින අයදුම් කරන ලද කැණීම් බලපත්‍රය සමාගමට ලබාදී නොතිබුණි.

(ඊ) සමාගමේ කැණීම් හා ගවේෂණ කටයුතු සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් ඉදිරිපත් කෙරේ.

(i) සමාගම සතුව 2028 වසර දක්වා වසර 10 ක් වළංගු කැණීම් බලපත්‍ර 03 ක් පවතින අතර ඉන් පොඩුවාකට්ටු ප්‍රදේශයේ කැණීම් කටයුතු සමාලෝචිත වර්ෂයේ මාර්තු සිට ජූනි දක්වා කාලපරිච්ඡේදය තුළ පමණක් සිදුකර තිබුණු අතර ඉන් ඛනිජ වැලි මෙ.ටො. 12,229 ක් කැණීම් කර තිබුණි. තෙවික්කල්ලු ප්‍රදේශයේ කැණීම් කටයුතු සමාලෝචිත වර්ෂයේ ජනවාරි මාසයේ පමණක් සිදුකර තිබුණු අතර ඉන් මෙ.ටො.19,433 ක් කැණීම් කර තිබුණි. මේ අනුව සමාගමේ කැණීම් කටයුතු පුල්මුඩේ ප්‍රදේශයේ කැණීම් මත වැඩි වශයෙන් රඳා පැවතුණි.

(ii) සමාගම සතු කැණීම් බලපත්‍ර ඈත උපයෝජිතව පැවතීම හා පවතින කැණීම් බලපත්‍රවල ධාරිතාවය ඉදිරි වර්ෂ 20 ක මෙහෙයුම් සඳහා ප්‍රමාණවත් නොවන බව සාධාරණීකරණය කර, ඉදිරි වර්ෂ 20 සඳහා කැණීම් සැලැස්මක් ඉදිරිපත් නොකිරීම මත භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් සමාගම විසින් ඉල්ලුම් කළ නව ගවේෂණ බලපත්‍ර 07 ක් සඳහා වූ අයදුම්පත් ප්‍රතික්ෂේප කර තිබුණි. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ප්‍රදේශයක් බැවින් කෝකිලායි කලපුවේ නයාරු-වෙම්මලෙයි ප්‍රදේශය සඳහා ලබාගත් අංක EL/406 දරන ගවේෂණ බලපත්‍රය මත ගවේෂණ කටයුතු අවසන් කර කැණීම් බලපත්‍රයක් ලබා ගැනීමට සමාගම අපොහොසත් වී තිබුණු අතර එම ගවේෂණ බලපත්‍රය 2022 දෙසැම්බර් 31 දින අවලංගු වී තිබුණි. මේ හේතු මත විගණිත දින වූ 2023 මැයි 31 දින වන විට සමාගම සතුව කිසිදු වළංගු ගවේෂණ බලපත්‍රයක් නොතිබුණි.

(iii) මේ අනුව 2028 වර්ෂයෙන් පසු සමාගම සතු කැණීම් බලපත්‍ර සියල්ලෙහිම වලංගු කාලය අවසන් වන අතර නව ගවේෂණද ආරම්භ කළ නොහැකිව ඇති බැවින් සමාගමේ ඉදිරි මෙහෙයුම් කාර්යසාධනය පසුබැසීමේ හැකියාවක් පැවතුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ අයවැයගත ඉල්මනයිට්, හයිටයි ඉල්මනයිට්, රූටයිල්, සර්කෝන් නිෂ්පාදනය පිළිවෙලින් මෙ.ටො. 66,250 ක්, 6,250 ක්, 4100 හා 1,250 ක් වූ නමුත්, සත්‍ය නිෂ්පාදනය මෙ.ටො. 29,741 ක්, 1,751 ක්, 741 ක් හා 268 ක් වී තිබුණි. ඒ අනුව සමාගම අපේක්ෂිත ඛනිජ වැලි නිෂ්පාදන ප්‍රමාණයට වඩා සත්‍ය නිෂ්පාදන ප්‍රමාණය මෙ.ටො. 45,349 කින් එනම්, සියයට 60 කින් අඩුවී තිබුණි.

(ඌ) ආයතනයේ අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියට පටහැනිව කළමනාකාර සේවා ගණයට (MM) අයත් තනතුරු දෙකක සේවයේ නියුක්ත අලෙවි කළමනාකාර සහ රසඥ යන නිලධාරීන්ට ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවා ගණයට (HM) අයත් රු.120,175 බැගින්ද, කණිෂ්ඨ කළමනාකරණ සේවා ගණයට (JM) අයත් තනතුරක් වන පරිපාලන නිලධාරී තනතුරක සේවයේ නියුක්ත නිලධාරියෙකු සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවා ගණයට (HM) අයත් රු.105,760 බැගින්ද වැටුප් ගෙවා තිබුණි. තවද, කණිෂ්ඨ කළමනාකාර සේවා ගණයට (JM) අයත් තනතුරු 3 ක සේවයේ නියුක්ත අභ්‍යන්තර විගණන නිලධාරීන් දෙදෙනෙකුට, සැපයුම් නිලධාරීවරයෙකුට සහ ගිණුම් නිලධාරී වරයෙකුට කළමනාකරණ සේවා ගණයට (MM) අයත් පිළිවෙලින් රු.71,050 ක්, රු.72,425 ක්, රු.71,050 ක් හා රු.69,675 ක් වන පරිදි වැටුප් ගෙවා තිබුණි.

(එ) අනෙකුත් ජංගම වත්කම්වල ඇතුළත් 2006 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ලැබිය යුතු රු.132,923,512 ක් වූ එකතු කළ අගය මත බදු වටිනාකම් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) 2004 මාර්තු 30 දිනැති අංක පීඊ/පීඔසීඔ/14/02 දරන භාණ්ඩාගාර ලේකම්ගේ ලිපිය මගින් සමාගමේ සේවකයන් සඳහා ගෙවනු ලබන ආහාර දීමනාව දිනකට රු.35 ක් සහ පැමිණීමේ දීමනාව මසකට රු.500 ක් අනුමත කර තිබුණද සමාගම විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත පමණක් ආහාර දීමනාව දිනකට රු.200 ක් දක්වා සහ පැමිණීමේ දීමනාව මසකට රු.2,000 ක් දක්වා වැඩිකර තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේදී පැමිණීමේ දීමනාව හා ආහාර දීමනාව ලෙස පිළිවෙලින් රු.6,975,000 ක් හා රු.42,831,450 ක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.

(ඔ) 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ සැපයුම්කාර ආයතන 28 ක් වෙත රු.2,172,200 ක මිලදී ගැනීම් අත්තිකාරම් ගෙවා තිබුණු අතර මිලදී ගැනීමේ කාර්යයන් නිම කර එම අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

මූල්‍ය ප්‍රකාශන

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2022	2021
		රු.	රු.
දළ පිරිවැටුම	3	7,562,825,994	2,720,198,305
අඩුකලා			
එකතු කළ අගය මත බද්ද		(280,963)	(283,428)
ශුද්ධ පිරිවැටුම		7,562,545,031	2,719,914,877
විකුණුම් පිරිවැය	4	(836,161,198)	(737,379,107)
දළ ලාභය		6,726,383,833	1,982,535,770
වෙනත් මෙහෙයුම් ආදායම්	5	214,629,219	1,107,992
		6,941,013,052	1,983,643,762
බෙදාහැරීමේ වියදම්	6	(10,725,367)	(19,056,350)
පරිපාලන වියදම්	7	(275,175,065)	(223,009,548)
වෙනත් මෙහෙයුම් වියදම්	8	(1,137,372,650)	(598,266,731)
එකතුව (6+7+8)		(1,423,273,082)	(840,332,629)
මෙහෙයුම් ලාභය		5,517,739,970	1,143,311,133
මූල්‍ය ආදායම්	9	642,685,067	243,675,186
වර්ෂයේ බදු පෙර ලාභය		6,160,425,037	1,386,986,319
ආදායම් බදු වියදම	10	(1,229,339,167)	(181,987,912)
වර්ෂයේ බදු පසු ලාභය		4,931,085,870	1,204,998,407
වර්ෂයේ ශුද්ධ ලාභය		4,931,085,870	1,204,998,407
කොටසක සාමාන්‍ය ඉපයීම	11	61.64	15.06
වර්ෂයේ ශුද්ධ ලාභය		4,931,085,870	1,204,998,407
වෙනත් විස්තීරණ අදායම්			
විශ්‍රාම ප්‍රතිලාභ බාරකම් මත ශුද්ධ			
ආයු ගණන ලාභය / (අලාභය)		47,425,410	41,134,030
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම		4,978,511,280	1,246,132,437

මූල්‍ය තත්ව ප්‍රකාශනය

දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	සටහන	2022	2021
වත්කම්		රු.	රු.
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	13	1,204,906,967	1,128,987,871
කල්බදු වත්කම්	14	16,656,607	17,488,013
අස්පෘශ්‍ය වත්කම්	15	59,649	138,694
අත්තිකාරම්	16	35,000,000	398,445,014
මුළු ජංගම නොවන වත්කම්		1,256,623,223	1,545,059,592
ජංගම වත්කම්			
තොග	17	1,465,161,825	1,332,750,552
කෙටිකාලීන මූල්‍ය වත්කම්	18	666,449,130	210,550,700
ස්ථාවර තැන්පතු	19	6,500,001,000	1,500,001,000
අත්තිකාරම් සහ තැන්පතු	20	495,152,854	152,719,855
කලින් ගෙවූ වියදම්	21	22,616,267	47,236,440
වෙනත් ලැබිය යුතු දෑ	22	380,220,754	354,512,383
මුදල් හා මුදල්වලට සමාන දෑ	23	277,646,229	702,998,927
මුළු ජංගම වත්කම්		9,807,248,059	4,300,769,858
මුළු වත්කම්		11,063,871,282	5,845,829,449
හිමිකම් හා වගකීම්			
හිමිකම්			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	24	800,000,000	800,000,000
රඳවාගත් ඉපයීම්/(අලාභ)	25	6,562,551,272	3,366,748,927
කොටස් හිමියන්ගේ මුළු හිමිකම		7,362,551,272	4,166,748,927
වගකීම්			
ජංගම නොවන වගකීම්			
විශ්‍රාම පාරිතෝෂික බැඳීම	26	37,403,028	70,034,775
විලම්බිත බදු	27	46,385,225	50,940,679
දිගුකාලීන ණය	28	8,431,183	25,269,104
		92,219,436	146,244,558
ජංගම වගකීම්			
ගෙවිය යුතු ආදායම් බදු	29	1,233,319,621	205,022,510
වෙළඳ හා අනෙකුත් ණය හිමියෝ	30	2,097,258,569	1,234,443,077
වෙන්කිරීම් හා උපචිත වියදම්	31	272,658,278	93,370,378
කෙටිකාලීන ණය	32	5,864,106	--
		3,609,100,574	1,532,835,964
මුළු වගකීම්		3,701,320,010	1,679,080,522
මුළු ස්කන්ධය හා වගකීම්		11,063,871,282	5,845,829,449

සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධායන්ට අනුකූල බව මම සහතික කරමි.

අත්සන් කළේ
ප්‍රධාන මූල්‍ය නිලධාරි
සුජීවා කාරියවසම්

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම, අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමකි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2022.04.04 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අනුමත කර අත්සන් තබනු ලැබුවේ

අත්සන් කළේ - මුදිත විජේසිංහ
සභාපති

අත්සන් කළේ - ආර්.එම්.ජේ.උදයකුමාර
අධ්‍යක්ෂ

අත්සන් කළේ - එස්.ඩබ්.මදනායක
අධ්‍යක්ෂ

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	රඳවාගත් ඉපයීම්/ (අලාභ)	එකතුව (රු.)
2021.01.01 දිනට ශේෂය	800,000,000	2,587,360,161	3,387,360,161
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම	--	1,204,998,407	1,204,998,407
වර්ෂය සඳහා වෙනත් විස්තීරණ ආදායම	--	41,134,030	41,134,030
පෙර වර්ෂයට ගැලපීම	--	(66,986,676)	(66,986,676)
රඳවාගත් ඉපයීම් ගැලපීම	--	243,004	243,004
භාණ්ඩාගාර ලාභාංශ		(400,000,000)	(400,000,000)
2021.12.31 දිනට ශේෂය	**800,000,000**	**3,366,748,926**	**4,166,748,926**
2022.01.01 දිනට ශේෂය	800,000,000	3,366,748,926	4,166,748,926
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම	--	4,931,085,870	4,931,085,870
වර්ෂය සඳහා වෙනත් විස්තීරණ ආදායම	--	47,425,410	47,425,410
පෙර වර්ෂයට ගැලපීම	--	(56,828,880)	(56,828,880)
රඳවාගත් ඉපයීම් ගැලපීම	--	---	---
භාණ්ඩාගාර ලාභාංශ		(1,725,880,054)	(1,725,880,054)
2022.12.31 දිනට ශේෂය	**800,000,000**	**6,562,551,272**	**7,362,551,272**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2022 රු.	2021 රු.
බදු පෙර ලාභය / (අලාභය)	6,160,425,037	1,386,986,319
ගැලපීම්		
ක්ෂය හා ක්‍රමක්ෂය	194,532,255	177,198,862
රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථා ණය ගැලපීම	362,195,014	51,742,145
පොළී ආදායම	(589,503,746)	(241,796,561)
පාරිතෝෂික	22,563,723	16,311,356
කල්බදු පොළි	2,163,557	3,512,651
දේපළ,පිරියත හා උපකරණ ඉවත් කිරීමේ ලාභ	(7,879,998)	---
කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය	6,144,495,842	1,393,954,772
තොගවල වැඩිවීම්/ (අඩුවීම්)	(132,411,274)	(241,723,418)
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ වැඩිවීම් / (අඩුවීම්)	(24,708,048)	(46,270,091)
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩිවීම් / (අඩුවීම්)	(103,586,892)	(110,288,138)
කලින් ගෙවීම් වැඩිවීම් / (අඩුවීම්)	24,620,173	8,316,742
අත්තිකාරම් හා තැන්පතු වැඩිවීම් / (අඩුවීම්)	(342,432,999)	(104,776,147)
උපචිත වියදම් වැඩිවීම් / (අඩුවීම්)	179,287,900	23,114,476
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය	(399,231,140)	(471,626,576)
ගෙවූ පාරිතෝෂික	(7,770,060)	(17,412,917)
ගෙවූ ආදායම් බදු	(225,259,641)	(213,367,636)
	(233,029,701)	(230,780,553)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	5,512,235,001	691,547,643
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		
ආයෝජනය සඳහා කළ තැන්පත් කිරීම්	(5,000,000,000)	793,477,814
පොළී ආදායම	74,964,180	183,882,978
පොළී ආදායම (ප්‍රති මිළදී ගැනීම)	12,507,781	6,756,900
ලැබූ අත්තිකාරම්	--	3,750,000
බැංකු ප්‍රති මිලදීගැනීම්	(5,242,815)	(60,707,520)
නොනිමි ප්‍රාග්ධන වැඩ	(129,552,640)	(78,760,449)
ඉඩම්, දේපළ පිරියත හා උපකරණ හා අස්පෘශය වත්කම් අත්පත් කර ගැනීම	(125,529,163)	(123,799,147)
ඉඩම්, දේපළ පිරියත හා උපකරණ බැහැර කිරීම් වලින් ලද මුදල්	7,880,000	---
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(5,164,972,657)**	**724,600,526**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		
වාහන කල් බදු ගෙවීම්	(13,137,372)	(13,366,912)
ගෙවූ ලාභාංශ	(759,477,670)	(700,000,000)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(772,615,042)**	**(713,344,912)**
මුදල් හා මුදල්වලට සමාන අගයන්හි ශුද්ධ වැඩිවීම / (අඩුවීම)	(425,352,698)	702,803,257
වර්ෂය ආරම්භයේ තිබූ මුදල් හා මුදල්වලට සමාන දෑ	702,998,927	195,670
	277,646,229	702,998,927
මුදල් හා මුදල් සමානතා විශ්ලේෂණය		
බැංකු ශේෂය	277,545,603	702,857,972
මුදල් ශේෂය	626	40,955
සුළු මුදල්	100,000	100,000
	277,646,229	702,998,927

ආයතනික තොරතුරු

1.1 පොදු

ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා රජයට අයත් ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරන ලද සීමාසහිත වගකීමක් ඇති සමාගමකි. එහි ලියාපදිංචි කාර්යාලය, අංක 341/21, සරණ මාවත රාජගිරිය හි පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් වල ස්වභාවය

සමාගමේ ප්‍රධානතම කාර්යය වනුයේ බර ඛනිජ වැලි කැණීම, සැකසීම සහ අලෙවිකරණයයි.

1.3 සමාගමේ සේවක සංඛ්‍යාව

වර්ෂය අවසානයේ දී සමාගමේ සේවක සංඛ්‍යාව 557 ක් විය.

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

2.1 සැකසීමේ පදනම

ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්හි මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) වලට අනුකූල වන ලෙස පිළියෙල කර ඇත. මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන පිළියෙල කර ඇත. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) වලට අනුකූලව පිළියෙල කිරීමේ දී නිශ්චිත තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිතා කිරීම අවශ්‍ය වේ. ඒ සමඟ ම කළමනාකරණය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් යොදාගැනීමේ දී ඔවුන්ගේ විනිශ්චයන්ද මේ සඳහා පාදක කරගනී. ඉහළ මට්ටමක සංකීර්ණතාවන් සහිත ඇස්තමේන්තු හෝ මූල්‍ය ප්‍රකාශනවල ට වැදගත් වන උපකල්පන හා සටහන් 2A න් අනාවරණය කොට ඇත.

2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනස්කම්

අදාළ වන විටදී, වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සඳහා සහ වත්මන් වර්ෂය සමඟ සංසන්ධනාත්මක විය යුතු අවස්තාවලදී පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය කිරීම, සංශෝධනය කොට ඇත.

2.3 විදේශ මුදල් පරිවර්තනය

2.3.1 ඉදිරිපත් කිරීමේ හා ක්‍රියාකාරි ව්‍යවහාර මුදල්

ආයතන ක්‍රියාත්මක වන්නා වූ මූලික ආර්ථික පරිසරයට අදාළ වලංගු මුදල් භාවිතා කර මෙම මූල්‍ය වාර්තා වල අඩංගු ගණුදෙනු හා ශේෂයන් වාර්තාකරණය කර ඇත. සමාගම ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් (LKR) භාවිතා කර මෙම මූල්‍ය වාර්තා ඉදිරිපත් කර ඇත.

2.3.2 ගනුදෙනු හා ශේෂයන්

ගනුදෙනුව සිදුවන දිනයේ පැවති විනිමය අනුපාතිකය පදනම් කරගෙන විදේශීය මුදලින් සිදු වූ ගනුදෙනු ක්‍රියාකාරි මුදල් ඒකකයට පරිවර්තනය කරන ලදි. විදේශ විනිමය තුළින් ප්‍රකාශිත මූල්‍ය වත්කම් හා බැරකම් වර්ෂ අවසාන දිනට ඇති විනිමය අනුපාතයට පරිවර්තනය කිරීමෙන් සහ එවැනි ගනුදෙනුවන් පියවීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන විනිමය ලාභ හා අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ දක්වා ඇත.

2.4 දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ මූලිකව හඳුනාගෙන ඇත්තේ එම වත්කම් සමාගමේ කළමනාකරණය බලාපොරොත්තු වන පරිදි භාවිතා කළ හැකි තත්වය දක්වා ගෙන ඒමට කරන ලද සෘජු වියදම් ද සහිතව පිරිවැයට සටහන් කර ඇත.

දේපළ, පිරියත හා උපකරණ පසුකාලීනව පිරිවැයෙන් එහි සමුච්චිත ක්ෂය හා හානිකරන අලාභ අඩුකල පසු අගයට ගණනය කර ඇත.

පසුකාලීන පිරිවැය වත්කමේ ධාරණ අගයට එකතු කිරීම හෝ වත්කමක් ලෙස හඳුනාගනුයේ එයින් ජනනය වන ප්‍රතිලාභ සමාගම තුලට ගලා එන්නේ නම් සහ අයිතමයේ පිරිවැය විශ්වාසදායි ලෙස මැනිය හැකි විටදී පමණයි. අනෙකුත් සියළු අළුත්වැඩියා කිරීම් හා නඩත්තු කිරීම් සඳහා දරන වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි අදාල කාල පරිච්ඡේදයට අයත් වියදමක් ලෙස සලකනු ලබයි.

ඉඩම් ක්ෂය නොකරයි. අනෙකුත් වත්කම් සරල මාර්ග ක්ෂය ක්‍රමයට ගණනය කරන ලද ක්ෂය පහත දැක්වෙන පරිදි එහි තක්සේරු කාලය පුරා වෙන් කරනු ලබයි.

වැඩිබිම් සංවර්ධනය	අවුරුදු 20	5%
ගොඩනැගිලි	අවුරුදු 20	5%
යන්ත්‍රෝපකරණ හා පිරියත	අවුරුදු 10	10%
ලිහිල් මෙවලම් හා උපකරණ	අවුරුදු 10	10%
ලී බඩු, සවි කිරීම් හා උපකරණ	අවුරුදු 10	10%
මෝටර් රථ	අවුරුදු 5	20%
ජල සැපයුම්	අවුරුදු 10	10%
පාවෙන යාත්‍රා	අවුරුදු 10	10%
ගොහොරු පතල්	අවුරුදු 4	25%
පරිගණක දෘඩාංග	අවුරුදු 4	25%
උද්‍යාන සංවර්ධනය	අවුරුදු 20	5%

වත්කමක ඇස්තමේන්තුගත නැවත අයකරගත හැකි වටිනාකමට වඩා එහි ධාරණ අගය වැඩි වන අවස්ථාවක, වත්කමේ ධාරණ අගය නැවත අයකර ගත හැකි අගය දක්වා වහාම කපාහරිනු ලැබේ.

රජයේ තක්සේකරුවන්ගෙන් තක්සේරුවක් ලබා ගැනීමට සමාගම ගත් උත්සහයන් සඵල නොවූ හෙයින් දේපල පිරියත හා උපකරන නැවත තක්සේරු කිරීම තවම සිදු කර නොමැත.

2.5 අස්පෘශ්‍ය වත්කම්

පරිගණක මෘදුකාංග හා පදිධති අත්පත් කරගැනීමට සහ භාවිතයට සුදුසු තත්වයට ගෙන ඒමට දරන පරිවැය මත පදනම්ව, අත්පත් කරගත් පරිගණක මෘදුකාංග හා මෙහෙයුම් පද්ධති ප්‍රාග්ධනිත කර ඇත. අත්පත් කරගත් අස්පෘශ්‍ය වත්කම්, පරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ අඩුකල අගයට දක්වා තිබේ. මෙම පිරිවැයන් පහත දැක්වෙන පරිදි තක්සේරු කරන ලද ජීවිත කාලය තුල ක්‍රමක්ෂය කරනු ලැබේ.

පරිගණක මෘදුකාංග	අවුරුදු 04	25%

පරිගණක මෘදුකාංග වැඩ සටහන් නඩත්තු කිරීම ආශ්‍රිත පිරිවැය වියදමක් ලෙස සලකනු ලබයි.

2.5.1 කල් බදු වත්කම්

ලංකා බැංකු මූල්‍ය කල්බදු පදනම යටතේ අවුරුදු 4 කින් ගෙවා නිම කිරීම සඳහා වාහන 6ක් අත්පත් කර ගන්නා ලදි.

2.6 මූල්‍ය නොවන වත්කම් අපහායනය

සමාගම විසින් සෑම ගිණුම් කාල පරිච්ඡේදයක් අවසානයේ දී එහි දේපළ, පිරියත සහ උපකරණ හා අස්පෘශ්‍ය වත්කම් හි යම්කිසි අපහායනයක් සිදු වී තිබේද නැද්ද යන්න පිළිබඳ නිර්ණය කිරීම සඳහා එම වත්කම්හි ධාරණ අගයන් පිළබඳව පරීක්ෂාවක් කරයි. කිසියම් එවැනි ඇඟවීම් පවතින්නේ නම් , අපහායන අලාභයේ ප්‍රමාණය (පවතී නම්) නිර්ණය කිරීම සඳහා වත්කමේ නැවත අයකර ගත හැකි අගය ඇස්තමේන්තු කරයි. තනි තනි වත්කම් හි නැවත අයකරගත හැකි අගය ඇස්තමේන්තු කළ නොහැකි අවස්ථාවන්හි දී, සමාගම මූල්‍ය උත්පාදන ඒකකය නිර්ණය කරන අතර එම වත්කම අයත්වන මූල්‍ය උත්පාදන ඒකකයේ නැවත අයකර ගත හැකි අගය ඇස්තමේන්තු කරයි.

නැවත අයකරගත හැකි අගය වන්නේ, සාධාරණ වටිනාකමින් විකිණීම සඳහා දරණ වියදම අඩුකල පසු ලැබෙන අගය සහ භාවිතයෙන් ලැබෙන වටිනාකමෙහි වඩා වැඩි අගයයි. භාවිතයෙහි ලැබෙන වටිනාකම අගය කිරීමේ දී ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් එහි වර්තමාන අගයන් ලබාගැනීමට වට්ටම් අනුපාතිකය වර්තමාන වෙළඳපොලෙහි මුදල් සඳහා ඇති කාල අගයත් අදාල වත්කම් සඳහා වන නිශ්චිත අවදානමත් සැලකීමකින් හෝ ගැලපීමකින් තොරව ඇස්තමේන්තු කළ යුතුය.

වත්කම (හෝ මුදල් උපදන ඒකකයක) නැවත අයකරගත හැකි අගය එහි ධාරණ අගයට වඩා අඩුවෙන් ඇස්තමේන්තුගත වුවහොත් වත්කමෙහි ධාරණ අගය (ගෙවූ මුදල් උත්පාදන ඒකකයක) එහි නැවත අයකරගත හැකි අගය දක්වා අඩුකල යුතුය. අපහායන අලාභයන් වහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ගැලපීම් කල යුතුය.

2.7 මූල්‍ය වත්කම

2.7.1 වර්ගීකරණය

සමාගම තම මූල්‍ය වත්කම් හඳුනාගැනීමේ දී ණය හා ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කිරීම පහත පරිදි තීරණය කර ඇත.

ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ යනු ව්‍යුත්පන්න කල නොහැකි, ස්ථීර හෝ නිශ්චිත වූ ගෙවීම් වලින් යුක්ත වන සක්‍රිය වෙළඳ පොල තුළ ලැයිස්තුගත නොවූ මූල්‍ය වත්කම් වේ. මේවා අන්තර්ගත වනුයේ ඍංගම වත්කම් තුල වන අතර ඍංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලබන කල් පිරීමේ කාලය මාස 12 ඉක්මවන මූල්‍ය වත්කම් අදාල වනුයේ නැත. සමාගමේ ණය සහ ලැබිය යුතු දෑ යන්නට වර්ෂය අවසාන දිනට ඇති වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ, කලින් ගෙවීම්, තැන්පතු, සේවකයන්ට දුන් ණය , මුදල් හා මුදල් සමාන දෑ තුල අඩංගු වේ.

2.7.2 හඳුනාගැනීම හා මුල්වරට අගය කිරීම

ණය සහ ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කර ඇති මූල්‍ය වත්කම් මුල් වරට හඳුනා ගත යුත්තේ ආයතනය විසින් ගණුදෙනුව මුල්වරට උත්පාදනය කල දිනයේය. මූල්‍ය වත්කමක් මුල් වරට අගය කල යුත්තේ සාධාරණ අගයට, සෘජුවම අදාල කළහැකි පිරිවැයක් එකතු කිරීමෙනි.

මූල්‍ය වත්කම් හඳුනාගැනීම නවතා දැමිය යුත්තේ මූල්‍ය වත්කමකින් අරමුදල් ගලා ඒමේ අයිතිය කල් පිරුණු විටකදී හෝ එය වෙනත් පාර්ශවයකට මාරු කල විටකදී හා සමාගම මූල්‍ය වත්කමෙ අයිතිය මත ඇති ප්‍රමාණාත්මක අවදානම් හා ප්‍රතිලාභ මාරු කළ විටදීය.

2.7.3 පසුකාලීනව සිදුකරනු ලබන අගය කිරීම

ණය සහ ලැබිය යුතු දෑ පසුකාලීනව අගය කල යුත්තේ සඵලදායී පොළි අනුපාතයට ගණනය කල ක්‍රමක්ෂය වූ පිරිවැයෙන් අපහායනය සඳහා වූ වෙන්කිරීම් අඩුකල පසු අගයටයි.

2.7.4 මූල්‍ය වත්කම් අපහායනය කිරීම
ක්‍රමක්ෂය වූ පිරිවැය මත පවත්වාගෙන යනු ලබන වත්කම්

සමාගම සෑම ගිණුම් කාල පරිච්ඡේදයක් අවසානයේදීම තම මූල්‍ය වත්කම් හානිකරණයට ලක් වී ඇති බවට ප්‍රමාණාත්මක සාක්ෂි තිබේ ද නැද්ද යන්න විමසා බැලිය යුතුය. මූල්‍ය වත්කමක් අපහායනය කිරීම සහ එම අපහායන අලාභය දැරිය යුතුතේ, මුල්වරට හඳුනාගැනීමෙන් පසු ඇති වූ එක් හේතුවක් (සිදුවීමක්) හෝ හේතු කිහිපයක් නිසා අපහායනය වූ බවට ප්‍රමාණාත්මක සාක්ෂි ඇත්නම් පමණක් හා එම අලාභ සිදුවීමෙන් අනාගත මූලය ප්‍රවාහයන් මත ඇති වන්නා වූ බලපෑම විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කල හැකි නම් පමණි.

ක්‍රමක්ෂය වූ පිරිවැය මත පවත්වාගෙන යනු ලබන ණය සහ ලැබිය යුතු දෑ වල අපහායන අලාභය හඳුනාගත යුත්තේ වත්කම පවත්වාගෙන යන අගය හා එම වත්කමේ අනාගත මුදල් ප්‍රවාහයන් සඵලදායි පොළී අනුපාතය මත වට්ටම් කළ පසු අගය අතර ඇති වෙනසයි. අනාගත මුදල් ප්‍රවාහයන් සැලකීමේ දී දරනු නොලබන අනාගත අපේක්ෂිත අලාභ අයත් නොවේ. වත්කමේ පවත්වාගෙන යනු ලබන අගය අඩු කල යුතු අතර අලාභය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගත යුතුය. යම් හෙයකින්, පසු කාලපරිච්ඡේදයකදී, හඳුනාගත් අපහායන අලාභය අඩු වුවහොත් සහ එම අඩුවීම අපහායනය හඳුනාගත් පසු ඇතිවූ කිසියම් සිදුවීමකට අදාල කල හැකිනම් කලින් හඳුනාගත් අපහායන අලාභය විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ යලි ප්‍රත්‍යාවර්තනය කරයි.

2.8 තොග

තොග අගය ප්‍රකාශයට පත් කරනුයේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන අගයන් වලින් අඩු අගයටයි. පිරිවැය හඳුනාගනුයේ බර තැබූ සාමානය පිරිවැය අගය මත පදනම්වය. 2018 වර්ෂය දක්වා මුල් නිෂ්පාදන ඒකක වලට සාමානුපාතිකව බෙදාහරනු ලැබීය. 2019 සිට සහ ඉදිරියට අදාල නිෂපාදනයන් ඒකක මිලෙහි වටිනාකම මත පාදකව නිෂ්පාදන අතර මුලු නිෂ්පාදන පිරිවැය බෙදාහරනු ලබයි.

2.9 වෙළඳ ලැබිය යුතු දෑ

වෙළඳ ලැබිය යුතු දෑ යනුවෙන් අදහස් කරනුයේ ආයතනයේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලින් ඇති වූ භාණ්ඩ විකුණුම් සඳහා පාරිභෝගිකයින් / ගැණුම්කරුවන්ගෙන් ලැබිය යුතු මුදල් වේ. ව්‍යාපාරයේ සාමාන්‍ය ව්‍යාපාරික චක්‍රය තුලදී එකතු කර ගැනීමට බලාපොරොත්තු වන අතර ඒවා ඡංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත.

වෙළඳ ලැබිය යුතු දෑ හඳුනාගත යුත්තේ සාධාරණ අගය නැතහොත් ඉන්වොයිස් අගය මත වන අතර, පසුකාලීනව අගය කල යුත්තේ මුදලේ කාලීන වටිනාකමේ වැදගත් බලපෑමක් ඇති නොවන්නා වූ, කෙටි කාලයකදී ලබා ගැනීමට බලාපොරොත්තු වන සත්‍ය ඉනවොයිස් අගයෙන් අපහායනය සඳහා වන වෙන්කිරීම් අඩුකල පසු අගයටයි.

සමාගම සෑම ගිණුම් කාලපරිච්ඡේදයක් අවසානයේදීම තම වෙළඳ ලැබිය යුතු දෑ අපහානය වී ඇති බවට පැහැදිලි සාක්ෂි පවතීද නැත යන්න විමසා බැලිය යුතුය. වෙළඳ ලැබිය යුතු දෑ සඳහා වූ අපහායන සාක්ෂි තුළ මුදල් එකතු කර ගැනීම සම්බන්ධව ආයතනයේ අතීත අත්දැකීම් නැතහොත් විලම්භිත ගෙවීම්වල වැඩිවීමක් ඇතුළත් විය හැක. වෙළඳ ලැබිය යුතු දෑ අපහායනය දැරිය යුත්තේ අපහායනය වූ බවට පැහැදිලි සාක්ෂි ඇත්නම් පමණි.

2.10 මුදල් හා මුදල් සාමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ මුදල් හා මුදල් සමාන දෑ යන්න තුළ අන්තර්ගත වනුයේ ඇතැති මුදල්, බැංකුවේ ඇති ඉල්ලුම් තැන්පතු, සත්‍ය කල් පිරීමේ කාලයේ මාස තුනක් හෝ ඊට අඩු ඉහල ද්‍රවන ද්‍රව ශීලතාවයකින් යුතු වෙනත් කෙටි කාලීන ආයෝජනයන්ය.

2.11 ප්‍රකාශිත ප්‍රාග්ධනය

ප්‍රකාශිත ප්‍රාග්ධනය තුළ නිරූපණය වනුයේ නිකුත් කළ කොටස් අගය වේ. සමාන්‍ය කොටස් හිමිකම් ලෙස වර්ගීකරණය කර ඇත.

2.12 මූල්‍ය වගකීම්

සමාගම මූල්‍ය වගකීම් වෙනත් මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කෙරේ. සමාගමේ වෙනත් මූල්‍ය වගකීම් තුළ අන්තර්ගත වනුයේ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ය. වෙනත් මූල්‍ය වගකීම් මුල්වරට හඳුනාගනුයේ සාධාරණ අගය හා සෘජුවම අය කළ හැකි පිරිවැය යන අගයන්ගේ එකතුවටය. මුල්වරට හඳුනා ගැනීමෙන් පසු මෙම මූල්‍ය වගකීම් අගය කර ඇත්තේ කෙටි කාලයක් තුළ පියවා දැමීමට බලාපොරොත්තු වන මුදලේ කාල වටිනාකමේ වැදගත් බලපෑමක් නොවන්නා වූ සත්‍ය ඉන්වොයිස් මතය සමාගම මූල්‍ය වගකීම් හඳුනා ගැනීම නවතා දමනුයේ ගිවිසුම් ගත වගකීම් විසර්ජනය කිරීමකදී, අවලංගු කිරීමකදී හෝ කල් පිරීමකදීය.

2.13 වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ

වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ යනු ආයතනයේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී සැපයුම්කරුවන්ගෙන් අත්පත් කරගත් භාණ්ඩ හා සේවා සඳහා ගෙවීමට ඇති බැඳියාවයි. වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරනුයේ ඒවා ආයතනයේ සාමාන්‍ය ව්‍යාපාරික චක්‍රය තුළ සිදුවන බැවිනි.

වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ මුල්වරට හඳුනාගත යුත්තේ සාධාරණ අගය නැතහොත් ගනුදෙනුවල මිල මත වන අතර පසුකාලීනව අගය කළ යුත්තේ මුදලේ කාල වටිනාකමේ වැදගත් බලපෑමක් නොවන්නා වූ, කෙටි කාලයක් තුල පියවා දැමීමට බලාපොරොත්තු වන සත්‍ය ඉන්වොයිස් මතය.

2.14 ජංගම හා විලම්භිත බදු

කාලපරිච්ඡේද සඳහා වූ බදු වියදම තුළ අන්තර්ගත වනුයේ ජංගම හා විලම්භිත බදු වේ. වෙනත් විස්තීර්ණ ආදායම් සඳහා අදාළ වන්නා වූ අයිතමයන් හැරුනු කොට, බදු වියදම සමාගමේ විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගෙන ඇත. මෙහිදී වෙනත් විස්තීරණ ආදායම් තුළද බදු හඳුනාගෙන ඇත.

කාලපරිච්ඡේදය සඳහා අදාළ වන්නා වූ ජංගම ආදායම් බද්ද ගණනය කොට ඇත්තේ කාලපරිච්ඡේදය අවසානයේ බල පවත්නා, සමාගමට අදාළ වන්නා වූ බදු නීතිය මත පදනම්වය. කළමනාකරණය විසින් බදු පාලනාධිකාරිය වෙත ගෙවීමට බලාපොරොත්තු වන අගය මත පදනම්ව, සුදුසු තැන්හිදී වෙන් කිරීම් සිදුකර ඇත.

මූල්‍ය ප්‍රකාශන තුළ විලම්බිත බදු හඳුනාගෙන ඇත්තේ වත්කම් හා වගකීම් සඳහා වන බදු පදනම මත ඒවා පවත්වාගෙන යන ධාරණ අගය අතර ඇති වන්නා වූ තාවකාලික වෙනස්කම් මත පදනම්වයි. ව්‍යාපාර ඒකාබද්ධ වීමේදී, එම ගනුදෙනුවන් ගිණුම්කරණ හෝ බදු අයවන ලාභය හෝ අලාභය මත වන බලපෑම හැරුණු කොට මුල්වරට හඳුනාගන්නා වත්කම් හා වගකීම් සඳහා විලම්භීත බදු ගණනය කර නැත. විලම්භීත බදු තීරණය කිරීම සඳහා කාල පරිච්ඡේදයේ අවසාන දිනට බලපවත්නා බදු අනුපාතයන් සැලකිල්ලට ගෙන ඇති අතර විලම්භීත බදු අදාළ වන්නා වූ බදු වත්කම හඳුනාගැනීමේ දී හෝ විලම්භීත ආදායම් බදු වගකීම් පියවීමේ දී අදාළ කර ගැනීමට බලාපොරොත්තු වේ.

විලම්භීත බදු වත්කම් හඳුනා ගනුයේ එම අනාගත බදු අය කළ හැකි ලාභය තාවකාලික වෙනස්කමට එරෙහිව ලබාගත හැකි බව ප්‍රත්‍යක්ෂ වන ප්‍රමාණය දක්වා පමණි.

විලම්භීත බදු හිලව් කිරීමක් සිදුකර කරනුයේ ජංගම බදු වත්කම්වලට එරෙහිව ජංගම බදු වගකීම් හිලව් කිරීම් සඳහා නෛතිකමය වශයෙන් බලගැන්වුණු හිමිකමක් ඇත්නම් පමණක් සහ ආදායම් බදු සඳහා අදාළ වන්නා වූ විලම්භීත බදු වත්කම් හා වගකීම් පැනවීම එකම බදු අධිකාරියක් විසින් සිදුකරනම් පමණි.

2014 /2015 තක්සේරු වර්ෂයට අදාළ ආදායම් බදු සඳහා අභියාචන කොමිසමේ අභියාචනයක් ගොනුකර ඇත බැංකු ණයකරක් හා තැන්පත් මේ සඳහා ලබා දී ඇත.

2.15 සේවක ප්‍රතිලාභ

ආයතනය සතුව නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් හා නිශ්චිත දායකත්වය සැලසුම් යන සේවක ප්‍රතිලාභ සැලසුම් ඇත.

2.15.1 නිශ්චිත දායකත්ව සැලසුම්

නිශ්චිත දායකත්ව සැලසුම් වූ කල්හි සමාගම විසින් වෙනත් ආයතනයක් සඳහා නිශ්චිත දායක මුදලක් ගෙවනු ලබන පශ්චාත් සේවක ප්‍රතිලාභ අරමුදලකි. තවදුරටත් පවත්නා වූ දායක ගෙවීමක් සඳහා ආයතනය සතුව පවත්නා වූ නෛතික හෝ ගිවිසුම්ගත බැඳීමක් නොමැත. දායකයන්, සේවක ප්‍රතිලාභ වියදම් ලෙස හඳුනාගනු ලබන්නේ ඒවා ගෙවිය යුතු නම් පමණි.

සමාගම විසින් සේවකයාගේ දළ පාරිශ්‍රමිකයෙන් 15% සේවක අර්ථසාධක අරමුදල වෙතටත් (EPF), 3% සේවා නියුක්තියකයන්ගේ භාර අරමුදල (ETF) වෙතටත් දායක වනු ලබයි.

2.15.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සම්බන්ධව ආයතනයේ වගකීම් වනුයේ කාල පරිච්ඡේදය අවසානයේ නිශ්චිත ප්‍රතිලාභ සැලසුමෙහි වර්තමාන අගය වේ. වාර්ෂිකව මෙහි අගය කිරීම සිදුකරනු ලබන්නේ පුරෝකථනය කළ ඒකක බැර ක්‍රමය භාවිතා කොට ගෙනය.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුමේ පිරිවැය ආයුගණන වටිනාකම් තක්සේරුව මත තීරණය කරන ලදී. වට්ටම් අනුපාතය, වත්කම්වල අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය, අනාගත සේවක පඩි වැඩිවීම, මරණ අනුපාතය හා අනාගත විශ්‍රාම වැඩිවීම පිළිබඳ උපකල්පන ආයුගණන තක්සේරුවේදී සලකා බැඳේ. තක්සේරුවේ සංකීර්ණත්වය සහ එහි දිගු කාලීන බව නිසා අදාළ උපකල්පනයන් සලකා බැලිය යුතු තරම් අවිනිශ්චිතතාවන්ට පත්වන අතර බැඳියාවද මෙම උපකල්පන හා ඇස්තමේන්තු මත වෙනස් වීමට ඉහළ සංවේදීතාවක් දක්වයි. අදාල ඇස්තමේන්තුවලදී යොදාගත් ප්‍රධාන උපකල්පන මූල්‍ය වාර්තාවල සටහන් අංක 26 හි දැක්වේ.

2.15.3 කෙටිකාලීන සේවක ප්‍රතිලාභ

කෙටි කාලීන සේවක ප්‍රතිලාභ සඳහා වන වගකීම් හඳුනාගනු ලබනුයේ සේවකයන් විසින් සපයන ලද සේවාවට අදාලව ගෙවීමට බලාපොරොත්තු වන, වට්ටම් නොකළ අගය මතයි.

2.16 වෙන්කිරීම් හා අසම්භාව්‍ය වගකීම්

ක්‍රියාකාරී වියදම් සඳහා වෙන් කිරීම් හඳුනා ගනු ලබන්නේ අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ආයතනය සතුව වර්තමාන නෛතික හා ගිවිසුම් ගත බැඳීමක් ඇති විටකදීත්, එම වගකීම පියවා දැමීම සඳහා සමාගමේ ආර්ථික සම්පත් පිටතට ගලායාම නිශ්චිත විටකදී, සහ එම අගයන් විශ්වාසනීය ලෙස තක්සේරු කළ හැකි විටදීය.

වෙන් කිරීම් අගය කරනුයේ වර්තමාන වගකීම් හා බැඳුණු අවදානම් හා අවිනිශ්චිත භාවයන් ඇතුළත්ව වඩා විශ්වාසදායක සාක්ෂි මත පදනම්ව තක්සේරු කරන ලද වර්තමාන වගකීම් පියවා දැමීම සඳහා අවශ්‍ය වන්නාවූ වියදම් මත වේ.

2.16.1 බොල් හා අඩමාන ණය සඳහා වෙන්කිරීම්

රාජ්‍ය සම්පත් කලමනාකරණ සංස්ථාවෙන් අයවීමට තිබූ රු.362,195,014 ක ණය ශේෂය වර්ෂය තුළ කපා හැර ඇත.

2.17 ආදායම් හඳුනාගැනීම

ආදායම් හඳුනාගෙන ඇත්තේ ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිඵලයෙහි සාධාරණ අගයට වන අතර භාණ්ඩ විකුණුම් සඳහා ලැබිය යුතු අගයන් ප්‍රකාශ කර ඇත්තේ එකතු කළ අගය මත වූ බද්ද අඩුකළ ශුද්ධ අගයටය. සමාගම ආදායම් හඳුනාගනු ලබන්නේ එම ආදායමේ වටිනාකම් පැහැදිලිව හඳුනාගත හැකි විටදී සහ එහි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුළට ගලා ඒමේ හැකියාව ප්‍රත්‍යක්ෂ විටදී පමණි.

ආයතනය විසින් ව්‍යාපාර තුළ උත්පාදනය වන්නා වූ ප්‍රධාන ගණයේ ආදායම් හඳුනාගැනීමට පහත දැක්වෙන ආදායම් හඳුනා ගැනීමේ නිර්ණායක භාවිතා කර ඇත.

2.17.1 භාණ්ඩ විකුණුම්

භාණ්ඩ විකුණුම් වලින් උත්පාදනය වන ආදායම හඳුනාගනුයේ ගැනුම්කරුට භාණ්ඩ පිළිබඳ අවදානම් හා ප්‍රතිලාභ මාරුවන අවස්ථාව වන භාණ්ඩ නිකුත් කළ අවස්ථාවේය.

2.17.2 පොළී ආදායම්

පොළී ආදායම හඳුනා ගනු ලබන්නේ සඵලදායී පොලි ක්‍රමය භාවිතා කොට ගෙනය.

2.17.3 සේවක ණය - මූල්‍ය මෙවලම්

සමාගම සේවක ණය සඳහා පොළිය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39ට අනුව ගණනය කරනු ලබයි.

2.17.4 දේපළ, පිරියත හා උපකරණ ඉවත් කිරීමෙන් ඇතිවන ලාභ හා අලාභ

වත්කමේ පවත්වාගෙන යන අගය හා විකුණුම් අගය සැසඳීමෙන් දේපළ, පිරියත හා උපකරණයන්හි ඉවත් කිරීමේ ලාභ හා අලාභ හඳුනා ගනු ලබන අතර එය විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හඳුනාගනු ලබයි.

2.18 වියදම්

ව්‍යාපාරයේ මෙහෙයුම් සිදුකරගෙන යාමේදී දරන ලද සියලුම වියදම්. ලාභය හඳුනා ගැනීමේදී අදාළ කාල පරිච්ඡේදයේ ආදායමට එරෙහිව කපා හල යුතුය.

2.19 ගිණුම් කාලපරිච්ඡේදය අවසානයට පසු හටගන්නා සිදුවීම්

ගිණුම් කාල පරිච්ඡේදයන් පසු ඇතිවන සියලු වැදගත් සිදුවීම් සැලකිල්ලට ගෙන ඇති අතර සුදුසු ගැලපීම් හා හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනය තුළ අදාළ සටහන්වල හෙළිදරව් කර ඇත.

2.20 වගකීම් (බැදියාව)

ගිණුම් කාල පරිච්ඡේද අවසානයට ඇති සියළු ප්‍රමාණාත්මක වගකීම් (බැඳීම්) හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් තුළදී හෙළිදරව් කර ඇත.

2A. වැදගත් ගිණුම්කරණ තක්සේරු කිරීම් හා මතයන්

මූල්‍ය ප්‍රකාශන පිළිවෙළ කිරීමේදී, වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් හඳුනා ගැනීම හා මැනීම පිළිබඳ කළමනාකරණය විසින් විවිධ වූ තත්වයන් මත, ඇස්තමේන්තු හා උපකල්පනය සැලකිල්ලට ගනු ලබයි.

2A.1 පහත දැක්වෙනුයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වැදගත් බලපෑමක් කළ හැකි මූල්‍ය / ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේදී භාවිතා කරන වැදගත් මතයන්ය.

2A1.1 විලම්භීත බදු වත්කම් හඳුනා ගැනීම

විලම්භීත බදු වත්කම් කෙතරම් දුරකට හඳුනාගන්නවාද යන්න තීරණය වෙනුවෙන් අනාගත ලැබිය හැකි බදු ආදායම් තක්සේරුවට එරෙහිව උපයෝගී කළ හැකි විලම්භීත බදු වත්කමේ සම්භාවිතාවය මතය.

2A.2 වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් හඳුනාගැනීමේදී හා අගය කිරීමේ දී බොහෝ දැනෙන බලපෑමක් කලහැකි උපකල්පන හා තක්සේරු කිරීම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

2A.2.1 ක්ෂය කල හැකි වත්කමක ඵලදායී ජීව කාලය

වත්කමක අපේක්ෂිත ආර්ථික උපයෝගීතාවය මත පදනම්ව, කළමනාකරණය විසින් සෑම වාර්තාකරන දිනකදීම ක්ෂය කළ හැකි වත්කමක ඵලදායී ජීවකාලයේ විමර්ශනය කළ යුතුය. මෙම තක්සේරුවල අවිනිශ්චිත භාවයන් තාක්ෂණික යල්පැනීම සමග සම්බන්ධ වන අතර, නිශ්චිත මෘදුකාංග හා තොරතුරු තාක්ෂණික උපාංගයන්ගෙන් උපයෝගීතාවය වෙනස් කිරීම කෙරෙහි බලපානු ඇත.

2A.2.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වගකීමේ වර්තමාන අගය තීරණය කිරීම උපකල්පනය ගණනාවක් මත ගොඩනැගුනු පුරෝකථනයක් කළ ඒකක බැර ක්‍රමය මත බලපාන සාධක විශාල ප්‍රමාණයක් මත පදනම් වෙයි. මෙම උපකල්පනය ශුද්ධ පිරිවැය තීරණය කිරීමට හා වට්ටම් අනුපාත ඇතුළත් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වගකීම් තීරණය කිරීමේදී යොදා ගනී. මෙම උපකල්පනයන්ගේ සිදුවන කිසියම් වෙනස්වීමක්, නිශ්චිත ප්‍රතිලාභ සැලසුමේ පවත්වාගෙන යන අගය කෙරෙහි මෙම උපකල්පන වල කිසියම් වෙනස්වීමක් බලපානු ලබයි.

		එකතු කල අගයමත	2022	2021
	දළ විකුණුම්	බදු	ශුද්ධ විකුණුම්	ශුද්ධ විකුණුම්
	(රු.)	(රු.)	(රු.)	(රු.)
සටහන 03 **පිරිවැටුම**				
රූටයිල්	1,035,876,883	(18,196)	1,035,858,687	256,400,129
ඉල්මනයිට්	6,186,955,079	(12,048)	6,186,943,031	2,305,051,101
සර්කෝන්	105,539,899	(250,325)	105,289,574	158,201,329
භයි.ටයි.ඉල්මනයිට්	234,451,195	(176)	234,451,019	4,086
මැග්නටයිට්	2,938	(218)	2,720	258,231
	7,562,825,994	280,963	7,562,545,031	2,719,914,876
සටහන 04 **විකුණුම් පිරිවැය**				
රූටයිල්			236,190,137	85,383,951
ඉල්මනයිට්			530,690,857	610,833,217
සර්කෝන්			18,998,045	41,119,463
භයි.ටයි.ඉල්මනයිට්			50,281,592	1,050
මැග්නටයිට්			568	41,426
			836,161,199	737,379,107

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සටහන 05** **අනෙකුත් මෙහෙයුම් ආදායම්**	**2022** **(රු.)**	**2021** **(රු.)**
වත්කම් විකිණීම් මත ලැබූ ලාභය	7,879,998	---
ප්‍රමාද ගාස්තු ආදායම	--	1,107,992
විනිමය අනුපාත උච්චාවචන	206,749,221	--
එකතුව	**214,629,219**	**1,107,992**

සටහන 06
බෙදාහැරීමේ වියදම්

	2022 **(රු.)**	**2021** **(රු.)**
වැටුප් හා වේතන	5,378,003	5,475,640
අතිකාල	22,168	37,162
පැමිණීමේ දීමනාව	243,600	221,200
ආහාර දීමනාව	215,600	150,000
අර්ථසාධක අරමුදල් දායකත්වය	1,045,095	827,010
වෛද්‍ය සහ වෛද්‍ය ආධාර යෝජනා ක්‍රමය	25,666	--
සේවක ප්‍රවාහනය	1,176,200	615,650
නිෂ්පාදන දිරි දීමනාව	212,300	--
බලපත්‍ර ගාස්තු	55,000	21,500
තැපැල් හා දුරකථන ගාස්තු	54,873	122,738
වාර සඟරා	1,837,190	704,229
වෙළඳ ප්‍රචාරණ හා අලෙවි ප්‍රවර්ධන වියදම් (දේශීය)	145,693	129,600
විනිමය උච්චාවචනය	65,000	--
බැංකු ගාස්තු	73,968	--
හුවමාරු උච්චාවචනය	--	10,601,135
සේවක භාර අරමුදල	175,010	150,486
එකතුව	**10,725,367**	**19,056,350**

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

සටහන 07 පරිපාලන වියදම්		2022 (රු.)	2021 (රු.)
අධ්‍යක්ෂවරුන්ට ගෙවීම්		1,658,500	1,460,000
සභාපතිගේ ගෙවීම්		1,130,000	1,200,000
නිෂ්පාදන දිරි දීමනාව		50,900	--
විනෝද ගාස්තු		257,500	300,000
ඉන්ධන හා ලිහිසි තෙල්		1,415,306	1,385,947
වාහන ධාවන වියදම්		4,680	--
තැපැල් හා දුරකථන ගාස්තු		67,800	156,000
වැටුප් හා වේතන		1,767,928	1,592,347
නිෂ්පාදන දිරි දීමනාව		50,900	--
සංග්‍රහ වියදම්		350	4,130
ඉන්ධන හා ලිහිසි තෙල්		372,590	211,110
වාහන ධාවන වියදම්		550	--
වැටුප් හා වේතන		--	613,000
පරිපාලන පොදු වියදම්	(සටහන 7ඒ)	268,398,060	216,087,014
එකතුව		275,175,064	223,009,548

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

සටහන 07 ඒ පරිපාලන/පොදු වියදම්	2022 (රු.)	2021 (රු.)
වැටුප් හා වේතන	65,932,688	65,097,457
අතිකාල	12,095,765	15,469,272
පැමිණීමේ දීමනා	3,620,656	3,434,400
පාරිතෝෂික දීමනා	21,353,563	13,548,340
ආහාර දීමනා	3,406,200	2,583,800
සේවක තේ	2,052,962	668,315
භාෂා දීමනා	60,065	70,130
අර්ථ සාධක අරමුදල් දායකත්වය	10,062,790	10,052,364
සේවක සුභ සාධන	2,204,415	2,434,853
25 වන සේවා ඇගයීම්	31,100	--
නිළ ඇඳුම්	486,843	2,373,972
වෛද්‍ය යෝජනා ක්‍රමය	998,375	1,354,391
ගමන් වියදම් හා යැපීම් දීමනා	199,438	584,154
සේවක ප්‍රවාහනය	8,745,987	9,181,365
නිෂ්පාදන දිරි දීමනාව	2,357,388	--
විනෝද ගාස්තු	32,090	2,355
සංග්‍රහ වියදම්	1,112,003	523,298
උපදේශන හා වෘත්තීය ගාස්තු	2,015,752	3,965,376
විදුලි ගාස්තු	2,488,200	2,221,566
ඉන්ධන හා ලිහිසි තෙල්	5,525,587	3,736,125
පාරිභෝගික දෑ	2,982,696	1,343,838
අළුත්වැඩියා හා නඩත්තු - උපකරණ	2,295,217	1,575,544
ජල ගාස්තු	569,945	421,279
සේවක පුහුණු වියදම්	68,025	23,000
කුලී සහ අනුපාත	10,392,682	10,310,270
රක්ෂණ - මෝටර් රථ	696,149	546,014
රක්ෂණ - මාර්ගස්ථ මුදල්	4,993	5,798
රක්ෂණ - විශ්වාසනීයත්ව ඇප	13,405	14,409
රක්ෂණ - ගිනි රක්ෂණ	13,199	13,338
රක්ෂණ - වෛද්‍ය	7,057,774	5,293,607

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2022 (රු.)	2021 (රු.)
බලපත්‍ර ගාස්තු	57,920	77,364
වාහන ධාවන වියදම්	5,627,277	3,872,316
වාහන කුලී ගාස්තු	205,243	4,034,359
තැපැල් හා දුරකථන	1,111,468	1,360,947
අන්තර්ජාල ගාස්තු	8,296	8,296
මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය	2,180,819	3,345,752
පොත් හා වාර සඟරා	--	120
දායකත්ව වියදම්	65,292	132,981
විවිධ වියදම්	99,801	241,823
විගණන ගාස්තු	735,000	800,000
ප්‍රචාරණ ගාස්තු	216,500	319,800
ආයතනික සමාජ වගකීම්	1,655,500	4,744,351
නීති ගාස්තු	2,545,982	2,364,640
පුවත්පත් නිවේදන	1,637,450	2,248,877
බැංකු ගාස්තු	984,518	395,770
බැංකු කල්බදු ගාස්තු - PJ 7705	176,967	316,912
බැංකු කල්බදු ගාස්තු - PJ 7706	189,173	338,771
බැංකු කල්බදු ගාස්තු - LO 5525	150,487	257,439
බැංකු කල්බදු ගාස්තු - CBJ 0284	648,879	1,062,313
බැංකු කල්බදු ගාස්තු - WPPK 6595	499,026	768,608
බැංකු කල්බදු ගාස්තු - WPPK 6596	499,026	768,608
ක්ෂයවීම	33,035,312	15,897,860
මෘදුකාංග ක්‍රමක්ෂය	79,045	138,606
කල්බදු ඉඩම් ක්‍රමක්ෂය	831,406	831,406
සේවක භාරකාර අරමුදල	1,856,309	2,013,105
ප්‍රසාද දීමනා	1,657,517	1,387,206
ලාභ දීමනා	42,767,897	11,510,154
එකතුව	**268,398,060**	**216,087,014**

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

සටහන 08 වෙනත් මෙහෙයුම් වියදම්	2022 (රු.)	2021 (රු.)
පොදු කාර්ය වියදම්	775,087,637	546,518,290
පරිත්‍යාග හා වෙනත්	90,000	6,296
බොල් හා අඩමාන ණය - ලියා හැරීම SRMC LTD	362,195,014	51,742,145
බොල් හා අඩමාන ණය - ලියා හැරීම	--	--
	1,137,372,651	**598,266,731**

සටහන 08 -1 පොදු කාර්යය වියදම්	2022 (රු.)	2021 (රු.)
කාර්යාල හා ආරක්ෂක	414,299,645	267,077,593
ගබඩාව	21,535,841	16,327,050
රසායනාගාරය	21,448,140	14,079,075
වැඩපල	71,808,192	46,931,406
ජල සැපයුම්	1,229,689	1,698,311
විදුලිබල සැපයුම්	5,908,068	3,100,245
යාත්‍රා	3,292,518	3,789,988
ගරාජය	9,812,134	9,093,115
නිවාස	48,787,391	42,282,870
සේවක සුබසාධනය	27,069,648	20,328,791
චුම්භක වෙන් කිරීමේ යන්ත්‍රාගාරය	72,981,931	56,609,466
තෙත් හා වියලි යන්ත්‍රාගාරය	76,897,350	65,200,281
කෝකිලායි යන්ත්‍රාගාරය	17,090	98
එකතුව	**775,087,637**	**546,518,289**
වෙනත් මෙහෙයුම් වියදමට මාරු කිරීම	--	--
සටහන 08	**775,087,637**	**546,518,289**

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සටහන 08 - 2** **නිෂ්පාදන පොදු කාර්යය**	**2022** **(රු.)**	**2021** **(රු.)**
ගබඩාව	13,527,397	16,986,662
රසායනාගාරය	13,472,310	14,647,868
වැඩපල	45,105,178	47,100,663
ජල සැපයුම්	772,410	1,766,923
බල සැපයුම්	3,711,059	3,225,495
මොබයිල් ගරාජය	6,163,336	9,460,476
නිවාස	30,645,027	43,991,094
සේවක සුබ සාධන	17,002,994	21,150,072
අවශෝෂණය නොකළ නිෂ්පාදන පිරිවැය 2021	18,115,382	
එකතුව	**148,515,093**	**158,329,253**

සටහන 09 - මූල්‍ය අදායම්

සාමාන්‍ය ආයෝජනයෙන් ලද පොළිය	12,507,781	6,756,900
ස්ථාවර තැන්පතු ආයෝජනයෙන් ලද පොළිය	561,519,950	227,929,103
කාර්ය මණ්ඩලය ලබාගත් ණය මත පොළිය හා අනෙකුත් ආදායම්	10,174,553	5,489,286
නිවාස ණය තුලින් ලද පොළිය - HDFC	1,541,107	1,166,889
විදේශීය විනිමය ගිණුම තුලින් ලද පොළිය	3,760,335	454,383
සන්තකවූ ටෙන්ඩර් තැන්පතු	53,181,321	1,878,625
එකතුව	**642,685,067**	**243,675,186**

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සටහන 10 - ආදායම් බදු වියදම්**	**2022** **රු.**	**2021** **රු.**
වර්ෂය සඳහා ආදායම් බදු වියදම සටහන - 10.1	1,233,894,621	171,000,000
විලම්භිත බදු	(4,555,454)	10,987,912
	1,229,339,167	**181,987,912**

සටහන 10.1
වර්තමාන ආදායම් බදු වියදම හා ගිණුම්කරණ ලාභය සැසඳුම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		2022 (රු.)	2021 (රු.)
බදු පෙර ගිණුම්කරණ ලාභය /අලාභය		6,160,425,037	1,386,986,319
බද්දට ඉඩ නොදෙන වියදම්වල එකතුව		258,938,380	344,124,081
බද්දට ඉඩ දිය හැකි වියදම්වල එකතුව		(680,497,646)	(371,043,422)
අනෙකුත් ආදායම් මාර්ගවල ආදායම්හි එකතුව		(642,685,067)	(243,675,185)
වර්ෂය සඳහා බදු අයවන ව්‍යාපාරික ලාභය/(අලාභය)		5,096,180,704	1,116,391,793
බද්දට අයත්වන අනෙකුත් ආදායම්		638,924,712	243,220,802
එකතු ව්‍යවස්ථාපිත ආදායම්		5,735,105,416	1,359,612,595
වගන්ති 32ට අනුව අඩු කිරීම්		(39,619,353)	(138,303,157)
තක්සේරු කල ආදායම		5,695,486,063	1,221,309,438
සුදුසුකම් ලබන ගෙවීම්		--	--
බද්දට යටත් වන ආදායම්		--	--
ආදායම් බදු වියදම්	- 14%	415,407,298	170,983,321
	- 30%	818,487,323	--
වැටයීම සරල කිරීම		1,233,894,621	171,000,000
එකතුව		**1,233,894,621**	**171,000,000**

සටහන 11 මූලික කොටසක ඉපයීම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2022 (රු.)	2021 (රු.)
සාමාන්‍ය කොටස් හිමියන්ට අයත් ශුද්ධ ලාභය/අලාභය	4,931,085,870	1,204,998,407
වර්ෂය තුළ බර තැබූ සාමාන්‍ය කොටස් ප්‍රමාණය	80,000,000	80,000,000
මූලික කොටසක ඉපයීම (රු.)	61.64	15.06

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සටහන 12 - පෙර වර්ෂය සඳහා ගැලපුම**	**2022** **රු.**	**2021** **රු.**
2021 වර්ෂය සඳහා ක්ෂය ඌන ප්‍රතිපාදන	2,313	187,186
2017 වර්ෂය සඳහා විගණන ගාස්තු ඌන ප්‍රතිපාදන	120,000	--
2021 වර්ෂය සඳහා ක්ෂය අතිරික්ත ප්‍රතිපාදන	574	(1,625)
තොග සඳහා ගැලපීම	(61,349)	44,316,286
තක්සේරු වර්ෂය 2021/2022 සඳහා ආදායම් බදු	53,684,641	20,967,225
විනෝද ගාස්තු සඳහා ගැලපීම	15,800	1,274,600
කෙරීගෙන යන වැඩ සඳහා ගැලපීම	2,671,088	243,004
පුරස්කාර ගැලපීම	44,014	--
ආහාර දීමනා සඳහා ගැලපීම	351,800	--
	56,828,881	**66,986,676**

සටහන 13 දේපළ, පිරියත හා උපකරණ

විස්තරය	01-01-2022 දිනට ශේෂය (රු.)	එකතු කිරීම (රු.)	(ඉවත් කිරීම්)/ ගැලපීම (රු.)	මාරු කිරීම් (රු.)	31.12.2022 දිනට ශේෂය (රු.)
පිරිවැය					
සින්නක්කර ඉඩම්	3,029,245	--	--	--	3,029,245
වැඩබිම් සංවර්ධනය	51,014,520	--	--	--	51,014,520
උයන වැඩි දියුණු කිරීම	4,520,948	--	--	--	4,520,948
ගොඩනැගිලි	297,660,598	41,093,582	--	--	338,754,180
යන්ත්‍ර හා පිරියත	1,048,729,951	11,600,039	--	--	1,060,329,991
ලිහිසි මෙවලම් හා උපකරණ	96,015,453	1,813,215	101,527	--	97,727,140
ලී බඩු, සවි කිරීම් හා උපකරණ	41,199,943	5,269,021	1,018	--	46,467,945
මෝටර් වාහන	500,144,950	81,005,821	--	--	581,150,771
ජල සැපයුම් යෝජනා ක්‍රමය	190,551,225	--	--	--	190,551,225
මුහුදු යාත්‍රා	10,931,234	--	1,100,000	--	9,831,234
පරිගණක දෘඩාංග	25,623,915	2,235,497	--	--	27,859,412
	2,269,421,982	**143,017,176**	**1,202,545**	--	**2,411,236,611**
ක්ෂය කිරීම්					
සින්නක්කර ඉඩම්	--	--	--	--	--
වැඩබිම් සංවර්ධනය	24,143,091	2,532,911	--	--	26,676,002
උයන වැඩි දියුණු කිරීම	734,582	226,047	--	--	960,630
ගොඩනැගිලි	121,225,898	12,709,191	--	--	133,935,090
යන්ත්‍ර හා පිරියත	660,651,158	76,505,161	--	--	737,156,319
ලිහිසි මෙවලම් හා උපකරණ	55,196,013	6,499,370	101,526	2,887	61,596,746
ලී බඩු, සවි කිරීම් හා උපකරණ	28,984,438	2,990,092	--	--	31,974,530
මෝටර් වාහන	308,916,419	72,695,961	--	--	381,612,380
ජල සැපයුම් යෝජනා ක්‍රමය	67,745,670	17,591,050	--	--	85,336,720
මුහුදු යාත්‍රා	10,811,319	115,105	1,099,999	--	9,826,422
පරිගණක දෘඩාංග	21,797,001	1,756,918	--	--	23,553,918
	1,300,205,589	**193,621,806**	**1,201,525**	**2,887**	**1,492,628,757**

ශුද්ධ ධාරණ අගය	969,216,393				918,607,857
අඩුකලා - ඉවත්කල අයිතම සඳහා වෙන්කිරීම්	-42				-42
	969,216,351				**918,607,815**
ප්‍රාග්ධන නොනිමි වැඩ	159,771,520	170,544,110	40,991,470	3,025,008	286,299,152
	1,128,987,871				**1,204,906,967**

සටහන 14 කල්බදු වත්කම්

විස්තරය	01-01-2022 දිනට ශේෂය රු.	එකතු කිරීම රු.	(ඉවත් කිරීම්)/ ගැලපීම රු.	මාරු කිරීම් රු.	31.12.2022 දිනට ශේෂය රු.
පිරිවැය					
කල්බදු ඉඩම්	24,222,333	---	---	---	24,222,334
ක්‍රමක්ෂය					
කල්බදු ඉඩම්	6,734,320	831,406	---	---	7,565,727
ශුද්ධ ධාරණ අගය	**17,488,014**	**831,406**	---	---	**16,656,607**

සටහන 15 අස්පෘශ්‍ය වත්කම්

විස්තරය	01-01-2022 දිනට ශේෂය (රු.)	එකතු කිරීම (රු.)	(ඉවත් කිරීම්)/ ගැලපීම (රු.)	මාරු කිරීම් (රු.)	31.12.2022 දිනට ශේෂය (රු.)
පිරිවැය					
පරිගණක මෘදුකාංග	4,573,033	---	---	---	4,573,033
ක්‍රමක්ෂය					
පරිගණක මෘදුකාංග	4,434,339	79,045	---	---	4,513,384
ශුද්ධ ධාරණ අගය	**138,694**	**79,045**	---	---	**59,649**

සටහන 16 අත්තිකාරම්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2022 (රු.)	2021 (රු.)
සී/ස රාජ්‍ය සම්පත් කළමණාකරණ සංස්ථාව	500,000,000	500,000,000
ලැබිය යුතු පොළී	17,421,448	17,421,448
අඩුකළා	517,421.448	517,421,448
බොල් හා අඩමාන ණය සඳහා වෙන්කිරීම - **SRMC**	(517,421,448	(155,226,434)
	--	362,195,014
රාජ්‍ය වැවිලි සංස්ථාව	25,000,000	25,000,000
ජනතා වතු සංවර්ධන මණ්ඩලය	5,000,000	6,250,000
ජාතික කඩදාසි සමාගම	5,000,000	5,000,000
	35,000,000	**398,445,014**

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සටහන 17 තොගය	2022 (රු.)	2021 (රු.)
පාරිභෝගික හා අමතර කොටස් යන්ත්‍රාගාරය	318,091,346	190,162,362
අඩුකලා		
තොගය සඳහා ගැලපුම	26,947,500	(27,217,591)
	291,143,846	162,944,770
පරිභෝජන හා අමතර කොටස් - ප්‍රධාන කාර්යාල	1,099,163	1,111,616
අමුද්‍රව්‍ය තොග	52,398,436	100,689,206
අතරමැදි නිෂ්පාදන න්න මැග්නටික්	3,860,995	1,320,412
අමුද්‍රව්‍ය තොග කෝකිලායි	3,071,946	--
නිමි භාණ්ඩ තොග		
- ඉල්මනයිට්	150,210,247	200,192,466
- රූටයිල්	53,052,819	170,218,937
- සර්කෝන්	43,859,089	24,088,402
- හයි ටයි ඉල්මනයිට්	109,568,224	91,573,179
අර්ධ සැකසූ නිෂ්පාදන තොගය		
- කෘඩ් සර්කෝන්	124,228,547	42,086,465
- මොනසයිට්	10,069,849	7,641,631
- ඉහළ ශ්‍රේණිය සර්කෝන් - ලොට් 02	373,775,762	310,148,847
- මැග්නටයිට්	7,801,276	6,119,872
- පහළ ශ්‍රේණිය සර්කෝන්	114,201,064	108,016,694
- ස්ක්‍රින් ඕර්සයිස් කොන්සන්ට්‍රේට්	30,045,056	28,337,715
- සර්කෝන් - ලොට් 01	21,775,168	21,775,168
- ටෙලින්ස් ඇනඩ් අප්ග්‍රේඩින්	2,131,824	2,131,824
- හයිඩ්‍රොසයිසර් ෆයින්ස්	72,868,513	54,353,346
	1,465,161,825	**1,332,750,551**

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2022 (රු.)	2021 (රු.)
සටහන 18 කෙටිකාලීන මූල්‍ය වත්කම්		
රීපෝ - ලංකා බැංකුව	150,182,210	144,939,395
පොළි ණයගැතියෝ	516,266,920	65,611,305
	666,449,130	**210,550,700**
සටහන 19 ස්ථාවර තැන්පතු		
ලංකා බැංකුව	6,500,000,000	1,500,000,000
ලංකා බැංකුව - ආරක්ෂක තැන්පතු	1,000	1,000
	6,500,001,000	**1,500,001,000**
සටහන 20 අත්තිකාරම් සහ තැන්පතු		
අත්තිකාරම් තැන්පතු	495,152,854	152,719,855
	495,152,854	**152,719,855**
සටහන 21 ඉදිරියට කළ වියදම්		
ඉදිරියට කරන ලද වියදම්	22,616,267	47,236,440
	22,616,267	**47,236,440**
සටහන 22 අනෙකුත් ජංගම වත්කම්		
ලැබිය යුතු එකතු කළ අගය මත බදු	132,923,512	131,923,189
විවිධ ණයගැතියෝ	18,150	49,000
HDFC නිවාස ණය පොළි	68,292,830	49,026,494
වෙනත් ණයගැතියෝ	3,763,425	23,246,359
සේවක ණය හා අත්තිකාරම්	175,222,837	150,492,503
	380,220,754	354,737,545
අඩුකලා - අපහායනය	--	(225,162)
	380,220,754	**354,512,383**

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සටහන 22.1 හානිකරනය /අපහායනය	2022 (රු.)	2021 (රු.)
වෙළඳ ණයගැතියන් සඳහා ක්‍රමක්ෂය දීමනාවේ හැසිරීම පහත පරිදි වේ.		
2022 ජනවාරි 01 දිනට ශේෂය	225,162	224,982
වර්ෂය තුළ නැවත අයකර ගැනීම	(225,162)	180
	--	225,162

සටහන 23 මුදල් හා මුදල් වලට සමාන දෑ

ලංකා බැංකුව - විදේශ මුසල් ගිණුම ගි.අ.	73449850	269,277,621	670,656,858
ලංකා බැංකුව - ආයතන ශාඛාව ගි.අ.	0000000931	4,612,345	28,831,469
ලංකා බැංකුව - පුල්මුඩේ ශාඛාව ගි.අ.	0002367534	372,323	149,479
හැටන් නැෂනල් බැංකුව - කුරුඳුවත්ත ශාඛාව ගි.අ.	0760010004078	3,176,605	3,190,155
මහජන බැංකුව - පුල්මුඩේ ශාඛාව ගි.අ.	052-100100000244	106,709	30,012
අතැති මුදල් - පුල්මුඩේ		626	40,955
සුළු මුදල් - ප්‍රධාන කාර්යාලය		50,000	50,000
විශේෂ අග්‍රිමය - ප්‍රධාන කාර්යාලය		50,000	50,000
		277,646,229	702,998,928

සටහන 24 ප්‍රකාශිත ප්‍රාග්ධනය

නිකුත්කල හා ගෙවා නිමකල 80,000,000 වූ සාමාන්‍ය කොටස්	800,000,000	800,000,000

සටහන 25 රඳවාගත් ඉපයීම් / (අලාභ)

ආරම්භක ශේෂය	3,366,748,927	2,587,360,162
භාණ්ඩාගාරයට ලාභාංශය	(1,725,880,054)	(400,000,000)
නිදන් අරමුදලින් රජයේ ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම	47,425,410	41,134,030
විශ්‍රාමික පාරිතෝෂික ලාභ, අලාභ	(56,828,881)	(66,986,676)
තොග ගැලපීම	--	243,004
වර්ෂයේ ලාභය /අලාභය	4,931,085,870	1,204,998,407
	6,562,551,272	3,366,748,927

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

සටහන 26
විශ්‍රාමික පාරිතෝෂික බැඳියාවට එරෙහිව ආයෝජන

	2022 රු.	2021 රු.
ජනවාරි 01 වන දිනට ශේෂය	70,034,775	112,270,365
විස්තීරණ ආදායම් තුළ හඳුනාගන්නා ලද වියදම් ආදායම (26.1)	22,563,723	16,311,356
වෙනත් විස්තීරණ ආදායම් තුළ හඳුනාගන්නා ලද ආයුගණන (ලාභ/අලාභ)	(47,425,410)	(41,134,030)
වර්ෂය තුළ ගෙවීම්	(7,770,060)	(17,412,917)
	37,403,028	70,034,774
අඩුකිරීම් - සැලසුම් කල වත්කම්වල සාධාරණ අගය	37,403,028	70,034,775
දෙසැම්බර් 31 දිනට ශේෂය		

සටහන 26.1 හඳුනාගන්නා ලද වියදම්

වර්තමාන සේවා පිරිවැය	1,581,305	3,467,626
වර්ෂය සඳහා පොළිය	20,982,418	12,843,730
	22,563,723	16,311,356

සටහන 26.2 ආයු ගණන උපකල්පන

ප්‍රතිලාභ වගකීමේ වර්තමාන අගය නිර්ණනය කිරීමේ දී සහ ගණනය කිරීමේ දී භාවිතා කරන මූලධර්ම ක්‍රියාකාරී උපකල්පනයට ඇතුළත් වන්නේ -

	2022 රු.	2021 රු.
වට්ටම් අනුපාත	29.96%	11.44%
වැටුප් වර්ධිත අනුපාත		
විශ්‍රාමික වයස	60 years	60 years
සේවක පිරිවැටුම් අනුපාතය		
55 දක්වා	0.84%	4.28%
ඊට පසු	0.00%	0.00%

මහා භාණ්ඩාගාර කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 30 (1) අනුව වාර්ෂික වැටුප් අනුපාත සකසා ඇත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සටහන 27 විලම්භීත බදු වගකීම**	2022 රු.	2021 රු.
ජනවාරි 01 වන දිනට ශේෂය	50,940,679	39,952,767
ආදායම් ප්‍රකාශනයට අය කිරීම	(4,555,454)	10,987,912
වර්ෂය තුළ පිළිගත් වත්කම්	--	--
දෙසැම්බර් 31 දිනට ශේෂය	46,385,255	50,940,679

සටහන 27.1 විලම්භීත බදු වත්කම් සහ වගකීම

	ධාරන අගය	බදු පදනම	ශුද්ධ	ශුද්ධ
	31.12.2022	**31.12.2022**	**31.12.2022**	**31.12.2021**
ප්‍රාග්ධන දීමනා මත විලම්භීත බදු වගකීම්	918,667,506	549,941,440	368,726,066	433,896,765
විශ්‍රාමික පාරිතෝෂික බැඳියාව මත විලම්භීත බදු වත්කම	(37,403,028)	---	(37,403,028)	(70,034,775)
ශුද්ධ තාවකාලික වෙනස			331,323,038	363,861,990
ප්‍රාග්ධන දීමනා මත විලම්භීත බදු වගකීම	368,726,066	* 14%	51,621,649	60,745,547
			51,621,649	60,745,547
විශ්‍රාමික පාරිතෝෂික බැඳියාව මත විලම්භීත බදු වත්කම	37,403,028	*14%	5,236,424	9,804,868
			5,236,424	9,804,868
දෙසැම්බර් 31 දිනට ශුද්ධ විලම්භීත බදු වගකීම			46,385,225	50,940,679

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2022	2021
සටහන 28 කෙටිකාලීන ණය	රු.	රු.
කල් බදු PJ 7705	--	2,125,606
කල් බදු PJ 7706	--	2,272,202
කල් බදු LO 5525	--	1,410,847
කල් බදු CBJ 0284	--	7,379,045
කල් බදු WPPK - 6995	4,215,592	6,040,702
කල් බදු WPPK - 6596	4,215,591	6,040,702
	8,431,184	**25,269,105**

සටහන 29 ආදායම් බදු වගකීම්

ජනවාරි 01 වන දිනට ශේෂය	205,022,510	142,400,411
වර්ෂය සඳහා වෙන් කිරීම්	1,233,894,621	171,000,000
වර්ෂය තුළ ගෙවීම්	(225,259,641)	(213,367,636)
ඌණ/අධි වෙන් කිරීම් ගැලපීම්	19,662,131	104,989,735
දෙසැම්බර් 31 දිනට ශේෂය	**1,233,319,621**	**205,022,510**

සටහන 30 වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ

ගැණුම්කරුවන්ගෙන් ලද අත්තිකාරම්	**250,456,796**	**312,430,075**
සුළු ණය හිමියෝ	29,576,375	24,780,771
රඳවාගත් මුදල්	14,770,078	12,526,117
සේවක වැටුප් හා ගෙවීම්	11,077,954	11,892,793
ටෙන්ඩර් තැන්පතු	57,729,095	112,295,223
උපචිත විශ්‍රාම පාරිතෝෂික	108,728	108,728
ගෙවිය යුතු ලාභාංශ	1,725,880,054	759,477,670
වෙළඳ ණය හිමියෝ	7,659,489	931,700
	2,097,258,569	**1,234,443,077**

සටහන 31 වෙන්කිරීම් හා උපචිත වියදම්

වෙන්කිරීම් හා උපචිත වියදම්	272,658,278	93,370,378

සටහන 32 කෙටිකාලීන ණය

කල් බදු PJ 7705	828,133	--
කල් බදු PJ 7706	885,247	--
කල් බදු LO 5525	604,778	--
කල් බදු CBJ 0284	3,545,948	--
	5,864,106	--